
- ඉලෙක්ට්‍රොනික පිටපත -
සැණෙළි වියුම්
අනිල් හේරත්

ඇවැත්නි, වැලිදු මම සංඥා සහිත සිත් සහිත බඹයක් පමණ වූ මේ සිරුරෙහි ම ලෝකයත්, ලෝක සමුදයයත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධ ගාමිණී පටිපදාවත් පණවමි.

**- සංයුත්ත නිකාය, රෝහිතස්ස සූත්‍රය**

# සබැඳි.


01. වියුම් පෙළ

02. කිරුල මිණි

03. අග පිටුව

04. ෆේස්බුක් පිටුව


** ඉහත ඇති සබැඳීන් හරහා අදාල කොටස් වෙත යා හැකි අතර සෑම පිටුවකම පහළින් ඇති පොතේ නම සහිත සබැඳිය හරහා 'වියුම් පෙළ' වෙත යොමුවිය හැක.

** මෙම සබැඳීන් ඇතැම් වෙබ් බ්‍රවුසරයකදී ක්‍රියාත්මක නොවිය හැකි හෙයින් පොත කියවීම සඳහා PDF කියවනයක් හෝ Ebook කියවනයක් නිර්දේශ කිරීමට කැමැත්තෙමු.

## අන්තර්ගතය වර්ගීකරණය

**ශෘංගාරාත්මක අන්තර්ගතයන් :** ★★★☆
ශෘංගාරාත්මක ක්‍රියාකාරකම් හා දෙබස් ඇතුලත් ය.

**අසැබි බස අන්තර්ගතයන් :** ☆☆☆☆
පරුෂ වචන හෝ සමාජ සම්මත අසැබි වදන් ඇතුලත් නොවේ.

**ප්‍රචණ්ඩත්වය හා බැඳි අන්තර්ගතයන් :** ★☆☆☆
ප්‍රචණ්ඩ ක්‍රියා ගැන සඳහන් වුව ද විස්තර ඇතුලත් නොවේ.

**වෙනත් සඳහන්**
බාල වයස් මත්පැන් පානය හෝ මත්කුඩු භාවිතය ආශ්‍රිත අන්තර්ගතයන් ඇතුලත් නොවේ.

වැඩිහිටි තේමාවන් ගෙන් යුතු ය.

**මුද්‍රිත පිටපත**

පළමුවන මුද්‍රණය 2017 වසරේ
රීඩ් ඩොට් එල්කේ පබ්ලිෂර්ස් විසිනි.

රීඩ් ඩොට් එල්කේ පබ්ලිෂර්ස්
93/6/1, සදහම් මාවත
බටලන්ද
හෙයියන්තුඩුව

දුරකථන : 077 834 4134
e-mail : info@read.lk

**ISBN 978-955-744-0-2**

© අනිල් හේරත්
සියලු හිමිකම් ඇවිරිණි.

**මුද්‍රණ සැලසුම**
සුනෙත් අනුරාධ

**සෝදුපත් බැලීම**
මුදිතා පෙරේරා

**කවර නිර්මාණය**
තරංග පුංචිහේවා

**මුද්‍රණය**
තරංජි ප්‍රින්ටර්ස් - මහරගම

# ඉලෙක්ට්‍රොනික පිටපත

ලේඛකයා, කෘතිය හා ප්‍රකාශකයා සඳහන් කරමින් කෙරෙන්නා වූ මුදල් ඉපැයීමේ අරමුණෙන් තොර ඕනෑම ආකාරයේ කටයුත්තක් සඳහා උපුටාගැනීමට හා මෙම කොන්දේසි ආකාරයෙන්ම බෙදාහැරීමටද අවසර ඇත්තේ ය.




**පිදුම**

සමර අයියා ට.

# ස්තූතියි ...!!!

බාර ගත්තා ට. පැතිරුවා ට.
විශ්වාසය ඇති කෙරුවා ට.

# ස්තූතිය

මේ පොත 2014 වසරේ සිට මුද්‍රණය සඳහා සූදානම් කෙරෙන්නකි . මෙතෙක් ප්‍රමාද වූයේ මගේම ඇතැම් සැසඳීම් හා කුසීතභාවයන් හේතුකොටගෙන ය. ඒ සියල්ල මැඬලමින් මේ පොත කරන්නට විශාලම මෙහෙයක් කළේ සුනෙත් ය. එහෙයින් මේ පොත නිසා මා විඳින - ඒ රහර්ෂයෙන් විශාල කොටසක හිමිකරුවා ඔහු ය. සුනෙත් අනුරාධ. ඔබට ඉතාමත් ස්තූති යැයි කියනු කැමැත්තෙමි.

මෙහි ඇති කථා බොහොමයක් ලියන්නැයි බලකොට ලියවන ලද ඒවා ය. පොතට එක්කරන විට කිහිපවර සංස්කරණය වී තිබුණත් ඒවා උපත ලැබුයේ ම ඒ බලකිරීම හේතුවෙනි. ඒ කාංචනා අමිලානි ගේ බල කිරීම ය . ඇය මුලින්ම මා ලියූ කථාවක් දිණම්ණෙහි පලකොට විශ්වාසය තනා දුන්නා ය. අනතුරුව මසකට දෙකකට වරක් කෙසේ හෝ කථාවක් ලියවා ගත්තා ය. අඩුපාඩු සොයා දුන්නා ය.
කාංචනා අමිලානි කරුණාමුනි. ඔබට ද ඉතාමත් ස්තූතියැයි කියන්නෙමි.

මගේ ලිවීම් සතතාභ්‍යාසාභිලාසයෙන් මුහුණු පොතේ ලියවෙනවාට අමතරව බ්ලොග් අඩවියක ද පලකරන්නට හුරු වී සිටින්නෙමි . වසර ගණනාවක සිටම. ඒ සෑම පලකිරීමක්ම පාහේ අගයමින් විචාරමින් මට හුරු හැඩයක් තනා ගන්නට උදව් වූ අයවළුන් අතරින් පෙරමුණ ගන්නේ තිසර ය.

මේ පොතෙහි කථා මටසිලිටු වී ඇත්තේ ඔහු වැන්නවුන්ගේ මැදිහත් වීම නිසා ය.

තිසර ශ්‍රීමාල්. ඔබට ඉමහත් ස්තූතිය පුදමි.

ඔවුන් පූර්වයෙහි තබා ස්තූති කල යුතු තව බොහෝ අය ඇත.

ඒ අතරින් මෙහි කටු සටහනක් යවා අදහසක් විමසූ පමාවෙන් සිය වේලාව වෙන්කොට දීර්ඝ සටහන් ලියා එවූ ඩෝසන් ප්‍රීති , සචින් ජයනෙත්ති හා නිරෝෂා ගුණවර්ධන ප්‍රධාන ය. ඔවුන්ට ද මාගේ හද පිරි ස්තූතිය හිමි විය යුතු ය.

අපගේ හැම හමුවීමකදීම පාහේ මේ පොත ගැන සිහිකරමින් සහෝදරත්වයෙන් මා දිරි ගැන්වූ ප් රභාත්, කන්ච්, රංගන, අකිලා, නර්මදා හා කාංචනා ප්‍රියකාන්ත යන ඉ-සංකලණියේ සොයුරු සොයුරියන්ව ද ස්තූති පූර්වකව සිහිකරමි.

මාගේ ලිවීම් දිරිගන්වමින් සිය මිතුරුකමේ ආශිර්වාදය ලබාදුන් රසිකා, තුෂාරිකා, උපේක්ෂා, යශෝධා, මලිති, දසුනි, වින්දාා, විදුර, රුවන්, මහේෂ්, කල්ප, විසල්, සහන් ඇතුළු බොහෝ දෙනෙකුට ද ස්තූතිය පුද කල යුතු ය.

සිය නොමසුරු සහයෝගය ලබා දෙමින් මා දැනුවත් කල හා මඟ පෙන්වූ නිලන්ත ගමගේ සහ ජනක ඉනිමංකඩ සොයුරන් මෙන්ම ඉතා කෙටි කලකදී මුද්‍රණය නිමකරදීමට භාරගත් තරංජි ප් රින්ටර්ස් අධිපතිතුමන් සමඟ සබැඳියාව ගොඩ නඟා දුන් රුවන් කරුණාරත්න නොවන්නට මෙම කර්තව්‍යය මෙතරම් පහසු නොවන්නට තිබිණි . එහෙයින් මේ ස්තූතිය ඔවුන් උදෙසා ද වෙන් විය යුතු ය.

එකම එක දැනුම් දීමෙන් පමණක් සෝදුපත් බලා දුන් මුදිතාටත් කවරය සකසා දුන් පුංචාටත් ඒ ස්තූතිය අඩුවක් නොමැතිවම හිමි ය.

ඒ මා ලියූ පොතට අදාලව ය.මේ පොත ලියූ මට අදාලව ය.

මම ජීවිතය අඩු නැතිව වින්ද ඇතැයි සිතමි. වින්දවා ද ඇතැයි සිතමි. ඒ සියළු විඳීම් වින්දවීම් වලට හේතුවූවා වූත් මා නිසා එවන් විඳීම් වින්දවීම් ලද්දා වූත් සියළු මනුෂ්‍යප්‍රාණීන් සිහිකරනු කැමැත්තෙමි. සම සිතින්.

එමෙන්ම මා විසින් මට ඇවැයි ලෙසින්ම ජීවත්වීමට යත්න දැරීම හේතුවෙන් ලැබුවා වූ සිය ළු හිත් රිදීම් ලබමින් වුව ද තවමත් මා ඉවසා දරාගෙන සිටින ඉදිරියටත් ඉවසා දරාගෙන සිටීමට නියමිත අම්මාත් අප්පච්චීත් බිරින්දැත් දියණියත් සෙනෙහසින් සිහිකරමි.

අවසාන වශයෙන් පොතපතෙහි වේවා , අන්තර්ජාලයෙහි වේවා , ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ වේවා භාෂාව හසුරුවන, හැසිරවූ හා හැසිරවීමට නියමිත, ඒ හැසිරවීම තුලින් මිනිස් සමාජයේ ප්‍රගමනය පතන සියළු ගැහැණුන්ට මිනිසුන්ට මගේ ආචාරය පුද කරමි.


අනිල් හේරත්
anilherath@gmail.com
0772003407

# වියුම් පෙළ

හෙමින් යන බස්

කහ සහ ගෝවා

කැති සහ පිහි

වැලන්ටයින්

කෝච්චි සහ ස්වයංවරය

අත් සහ මාංචු

රතු සහ කළු

තුන්වෙනි සීනුව

මුදු සහ කෙස්

කඩදාසි

සබන් කොළ

කුළු සහ පොලු

නිය පිට ගහ

# හෙමින් යන බස්.

චන්ද්‍රසේන. බසය පිරෙන්නට සෙනඟ සිටිය ද, වේලා සටහන්කරු කිහිප විටක් නලාව පිඹිබ ද, බසය ඉදිරියට නොගත්තේ ය. ඉදිරිය බලාගෙනම සිටියේ ය. පණගැන්වූ රියෙහි සුක්කානම මත දෑත තබාගෙනම.

දහදිය. බසය පිටත්වී නොතිබුණ ද ඇතුලෙහි සිටියවුන් දහදියෙන් පෙහෙමින් සිටිය හ. අව්රශ්මියෙන් ද, ශරීරතාපයෙන් ද උපන් උණුසුම දරාගත නොහී.

ඊළඟ බස්රිය. චන්ද්‍රසේනගේ බස්රියෙහි ගෑවී නොගෑවී නතර කෙරිණි. නලාව හැඬවිණි. සය වරක්. මහ හඬින්. රියදුරු කියූ අසැබි වදන් යටපත් කරමින්.

චන්ද්‍රසේන බසය ඉබි ගමනින් ඉදිරියට ගත්තේ ය. අඩුම වේගය සහිත ගියරයෙහි උදව්වෙන්. පාරට දැම්මේ ය.

ඉදිරියට ගියේ ය . වේගය වැඩිනොකරම. නැවතුම් දාහතරක් පුරා බසය ගෙනාවේ ය . පල්ලම් වල නියුට්‍රල් කරමින් . ඉතිරි දුර පහළම ගියරයක එමින්. සෑම නැවතුමකම වැඩි වේලාවක් තබා ගනිමින්.
මගීහු. වැඩිව එන දාහයෙන් පෙලෙමින් සිටියෝ ය.

ඇතැමෙක්.නොසන්සුන් වෙමින් . කලයුත්තක් නොහී.
“ මූ කීයට යන්නද දන්නෑ හිතන් ඉන්නෙ...?“
තවෙකෙක්. දෙස් තියමින්. සෙමෙන්.
“ හෙමින් යනව මදිවට ෆෝන් එකත් කනේ ගහගෙන..!”
අනෙකෙක්. සිය පෙම්වතිය තමා දෙසට අදිමින්. බලවසයට වැහුණු ඉහෙන් අල්ලා.
“ මෙහෙට එන්න අම්මියො. මේ නාකියො බස් එකකවත් යන්න දන්නෑ...!“

සෙස්සෝ. නිදමින්. පාලකයන්ට බනිමින්. විපක්ෂය පලු හරිමින්. කලා විචාර කරමින්. සූප ශාස්ත්‍ර දොඩමින්. ක්‍රීඩා විස්තර කියමින්. ගණන් හදමින්. බසයේ වේගය අමතක කිරීමට යත්න දරමින් සිටියෝ ය.

චන්ද්‍රසේන. වම් අතින් තමා අසලම හුන් මඟියා හොඳින් පෙනෙන සේ දර්පණය සැදූවේ ය . පහළොස්වෙනි නැවතුමෙහි බසය නවතා තිබියදී. දකුණු අතින් ජංගම දුරකථනය දරාගෙන . මුහුණ කළු කරගත්තේ ය. මඟියාගේ රැවුම දැක.

සමන්තිකා.
දහසයවෙනි නැවතුමෙන් බසයට නැංගා ය.
සෙනඟ අතරින් මැද්දට ගියා ය . ජංගම දුරකථනයක් කනේ තබාගෙනම . අනෙක් උන් රවද්දී.

ආසන ඇන්දක් අල්ලාගෙන නතර වූවා ය.

චන්ද්‍රසේන. දුරකථනයට කෙදිරීය. සැරෙන්. සෙනෙහසින්.
“ මඟුලක් ද කරන්නෙ..? මැද්දෙ සෙනග වැඩියි. මේ ඉස්සරහට එන්න....!“

අනතුරුව.
දුරකථනය පසෙකින් තැබීය. බසය වේගවත්ම ගියරයට මාරු කළේ ය.

# කහ සහ ගෝවා.

කහ.
අවුරුදු කුමරිය තරඟය දා ඇය හැඳ සිටියේ කහපැහැති තනපටකි.
අයෝමය පුරුෂයා තරඟයට ඔහු ආවේ කහ පැහැති යට ඇඳුමකින් සැරසී ය.

ගෝවා.
ඔහු දිනපතා බිව් සුප් කෝප්පයට ගෝවා දැමීම අකැප විය.
ඇයගේ උදේ ආහාරයට ගෝවා සලාදයක් අනිවාර්යය විය. දිග. එතරම් නොමේරූ.

ඇය ගෝවා වලට අමතරව කොළ පැහැති එලවළුත් කහ පැහැති පලතුරුත් කෑවා ය . මඳ පමණ. ශරීර හැඩය නොනසා.
ඔහු මස් ද මාළු ද කෑවේය. තෙල්කෑම අඩුකළේ ය. ශක්ති ජනක කිරි බිව්වේ ය.

ඔහු උදෑසනම දිව්වේ ය. හවසට ජිම් ගියේ ය. රෑට කලින් නිදා ගත්තේ ය.
ඇය උඩරට ද පහතරට ද බැලේ නැටුම් ද නැටුවා ය. ශරීරය නම්‍යශීලී කරගත්තා ය.

ඇය රූ රැජින තරඟ අටකින් දිනුවා ය. මුල් කවර හයකට සිය රුව දුන්නා ය.
ඔහු පිට පිටම හතරවරක් අයෝමය පුරුෂයා වූයේ ය. අග කවර තුනක උඩුකය පෑවේ ය.

ඔහු දන්නා නොදන්නා ගැහැණු සිරුරු මත තම කාය ශක්තිය පෑවේ ය. ඉඳහිට මධුවිතක් ගත්තේ ය. පසුව වැඩිපුර.
ඇය දුටු නොදුටු පෙම්වතුන් හා ආදරබස් තෙපලුවා ය. ඇතැමුන් එවූ බෝනික්කන් තෑගි ලෙස ගත්තා ය. කාටත් හොරෙන් සැඟවූවා ය.

ඇය ජනාධිපති ආර්යාවක වීමට සිහින මැව්වා ය. ඇමතිවරු දෙදෙනෙකුගේ සිහින කුමරිය වූවා ය.
ඔහු ඇමතිවරයකු වීමට පැතුවේ ය.
මන්ත්‍රීවරයකුගේ ආරක්ෂකයකු වී ය.

මොනර පිල් වැටී ගියේ ය.
සිංහ කේසර ලිහී වැටුණේ ය.

ඇය යලි ගෙදර ආවා ය.
ගෙටම වී සිටියා ය.

ඔහු යලි ගම ආවේ ය.
උදේට වැඩිපුර නිදාගත්තේ ය.

ඔහු.
කපුවකු දුන් ඔත්තුව අනුව නෑසියන් හා ඇගේ නිවසට ආයේ ය.
කෝලිකුට්ටු හා බටර් කේක් කෑවේ ය . බැරැරුම් සිනාවක් පා නික්ම ගියේ ය.
ගේට්ටුව ළඟදී හැරී බැලී ය.

ඇය.
ඔහු දුන් අංකයට අකුරු කළා ය . ඉංග්‍රීසියෙන් සිංහලෙන්.

“ අම්ම කියන්නෙ මං වගේ කෙනෙක් රකින්න ඔයා වගේ ශක්තිවන්තයෙක් තමයි හරි යන්නෙ කියලා“

ගෝවා මල්.
මඳක් කහපැහැයට හුරු ය.

# කැති සහ පිහි.

ඇතැම්හු. දින දෙකකට වරක් බැගින් චිත්‍රපටය බැලූ හ. සවස දර්ශනය. යලි යලිත්. රැස්වීමක් සාකච්ඡාවක් හෝ උද්ඝෝෂණයක් තිබූ තැනකට ආසන්නම ශාලාවෙ හි.

චිත්‍රපටය. දින සියය ඉක්මවා ප්‍රදර්ශනය කෙරිණි. අති සාර්ථක ව. ආදායම් වාර්තා තබමින්.

නිපැයුම් පිරිවැය. පක්ෂයේ සහෝදරයෙකුගෙන් ලැබී තිබිණි. පිටරටෙක සරුවට වැවුණු. භීෂණ සමයේ පර්යටනය ව.

තිර රචනය. උපදේශක මණ්ඩලයක අධීක්ෂණය යටතේ කෙරිණී . පක්ෂය විසින් තෝරාගත් . ඉතිහාසය අසා ඇති. අනාගතය ගැන දැක්මක් ඇති. පක්ෂයට ලැදි. එහෙයින්ම ජනයාට ලැදි.

කථාව.
පක්ෂය ගැන වූයේ ය. එහි සාමාජියන් ගේ කැපවීම ගැන කියැවුණේ ය. නම් ගම් මනඃකල්පිත ව.

හේරත් මුදියන්සේලාගේ මහසෙන් බණ්ඩාර. එවන් එක් නමක් විය . මනඃකල්පිත. එක් සිද්ධියක වීරයා වූ. චිත්‍රපටයේ ආකර්ශණය දිනා ගත්.

සිද්ධිය.
පක්ෂය පිටියට ආ කාලයේ වූවකි. මඟ මඟ දැවුණු මස් මැදි වූ ටයරයන් එන්නට පෙර .

දුෂ්ඨයා.
ආණ්ඩුපක්ෂයේ ප්‍රභලයෙකි. කැඩූ මී රස වැටුණු. මී මධු රසින් මත්ව ගිය . දේවත්වයට මදක් මෙහාට ඔසවා තැබූ. සුරා බැලයන් කොන්ත්‍රාත්තු බැලයන් රැකියා බැලයන් ඇ බොහෝ දන විසින්.

තැන.
පිටියක්. චූල ජනපදයක. රැස්වීමකට පෙර.

මිනිස්සු.
මහසෙන් ඇතුළු අනුගාමිකයෝ.
කටු පඳුරු කැපූ හ. වැට මායිමේ ගොඩ කළ හ.
පොල් ගස් කැපූ හ. ඉරූ හ. වේදිකාව තැනුවෝ
ය. ස්පීකර් ගස් බැන්දෝ ය. කොඩි වැල් ඇදීමට
සූදානම් වූවෝ ය.

සහෝදරවරුන්. රැස්වීමට එන්නේ සවස ය.
ඊට පෙර. දුෂ්ඨයා ආවේ ය. බැල පිරිවරද සමඟම.

ඊළඟට. අසැබි වදන්. වැටහිරියා පොළු.
කෑගෑසීම්. දිවීම්. සටන් පාඨ. සාප කිරීම්.

අවසන. දුෂ්ඨයා බිම වැටී හුන්නේ ය.
ආයුධයකින් වූ කැපුම් සහිත ව.

ආයුධය. මහසෙන්ගේ අතෙහි වූයේ ය.

උපදේශක මණ්ඩලය ඒ ආයුධය කුමක් දැයි නොදැන සිටියෝ ය.
පුරාවෘත්තයෙහි ඒ ගැන විස්තරයක් නොවන හෙයින්. එහෙයින්ම එම සිද්ධිය යළි ලියූ හ. වඩා ප්‍රගතිශීලී ලෙස. ඵලදායී ලෙස. තාර්කික ලෙස.

මහසෙන් වීරයෙකි.
වීරයා ගොවියෙක් විය යුතු ය. චිත්‍රපටය නරඹන ගොවියන් තමා තුලින් වීරයා දැකිය යුතු ය . සමාජයේ කටු කොහොල් ඉවත් කිරීමට එක්විය යුතු ය. පක්ෂය හා.

කැත්ත.
ගොවි ජනතාව නියෝජනය කිරීමෙහිලා යෙදිය හැකි හොඳම ආයුධය ය. සංකේතය ය. ඔවුහු ඉන් කටු කොහොල් ඉවත් කරති. බිම වැපිරීමට සුදුසු ලෙස සකසති.

මහසෙන් දුෂ්ඨයා ට පහර දෙන්නේ කැත්තෙනි.

පහර දීමට පෙර.
මහසෙන් දේශනයක් පවත්වන්නේ ය. දුෂ්ඨයා ට. පංති අරගලය අගයමින්. ප්‍රේක්ෂකයාගේ මන බඳිමින්. අමතක නොවන ලෙස.
දෙමළ චිත්‍රපටයක තරම් නොවුනත්. ඒ ළඟටම.

අනතුරුව.
කැති පහර දෙන්නේ ය. ප්‍රේමයෙන් ද වෛරයෙන් ද එකවිට දිලෙසෙන දෙනෙතින් යුතු ව. පීඩිතයා කෙරෙහි ප්‍රේමයෙන්. පීඩකයා කෙරෙහි වෛරයෙන්.

ප්‍රේක්ෂකයෝ.
මහසෙන් හා පෙමින් බැඳුන හ. මහසෙන්ට පණ දුන් නළුවා ඇගයූ හ. කෙටි පණිවිඩ යැවූ හ. ජනප්‍රියම නළුවා කළ හ.

චිත්‍රපටය.
දින සියය ඉක්මවා ප්‍රදර්ශනය කෙරිණි. අති සාර්ථක ව. ආදායම් වාර්තා තබමින්.

නිශ්පාදකයෝ. අමන්දානන්දයට පත්වූ හ. පක්ෂය. නව ගැම්මකින් ඉදිරි මං බැලී ය.

දෙගොල්ලෝම.
දින සියය සමරන්න ට තීරණය කළ හ. උපහාර පුදමින්. මනඃකල්පිත නම් හිමි චරිතවල සැබෑ නම් වලට. ඒවායේ හිමිකරුවන් ට.

..........................................................................

" ගෞරවනීය සහෝදර පියල් කොඩිකාර "

නිවේදිකාව ඔහුට ආරධනා කලේ එසේ ය. ගරු බුහුමනැති ව . ආඩම්බරයෙන්. මහසෙන්ගේ දෙබස් මනසින් සිහිකරමින්. හද ගැස්ම වැඩිකර ගනිමින්.

පියල්. අසුනෙන් නැගිට්ටේ ය. වේදිකාව දෙසට ඇවිද ගියේ ය. දකුණට. ඉන්පසු වමට. අනතුරුව පඩි පහක් නැංගේ ය. වෙදිකාව මතට.

සම්මානය ගත්තේ ය. ආපසු හැරුණේ ය. ඇවිද ආවේ ය. නිවේදිකාවගෙන් දුරට.

නිවේදිකාව.
පියල්ට බාධා කළා ය. තම කිංකිණි හඬින්.

“ පියල් සහෝදරයා ! රැස්ව සිටින සහෝදර සහෝදරියන් ඔබේ වචන කිහිපයක් අසන්නට පුන පුනා බලා සිටිනවා. විශේෂයෙන් ම ඒ ත්‍රාසජනක අත්දැකීම ගැන"

පියල්.
ආපසු හැරුණේ ය. නිවේදිකාව දෙසට පියවර මැන්නේ ය. එදා වූ දේ සිහිකරමින්.

.................................................................

ඇමතියා. කෙළින්ම ආවේ වේදිකාවට ය. තමා සැරසිලි කරමින් සිටි.

ඇමති බැලයන්.
වේදිකාව පමණක් නොව පිටත සැරසිලි ද වනසන්නට පටන් ගත්තෝ ය.

සහෝදර අනුගාමිකයෝ.
ඔවුන්ට එරෙහි වෙමින් සිටියෝ ය. තම ශක්ති පමණින්.

ඇමතියා.
පිටිය දෙස බලා සිටියේ ය. පියල් අසලින්ම හිටගෙන. පිස්තෝලයක් ඇද ගත්තේ ය. අසැබි වදනින් කෑ ගසමින්. මැනුවේ ය.

පියල්.
එක වචනයක්වත් කථා කලේ නැත. කථා කරන්නට වේලා තිබුණේ නැත. උණ්ඩ වචන වලට වඩා බලවත් හෙයින්.
පහත් වූයේ ය. එකවරම. වම් මේස් ආවරණය තුළ සඟවා තිබූ ආයුධය ගත්තේ ය. දකුණතින්. බුහුටිව දිග හැරියේ ය. පහර දුන්නේ ය.ඇමතියාව බිම වට්ටමින්. පිස්තෝලය ද සමඟ ම.

.................................................................................................

මයික්‍රපෝනය. පියල්ගේ  අතට මාරු විණි . නිවේදිකාවගෙන්.

පියල්. මයික්‍රෆෝනය තදින් අල්ලාගත්තේ ය . පිරිස දෙස බැලී ය. හඬ අවදි කළේ ය. වරදකාරී ස්වරයකින්.

“ ඒක කැත්තක් නෙවෙයි ...!! දැලි පිහියක්”

# වැලන්ටයින්.

ඇය.
බොහෝ ලස්සන නොවූවා ය. කොහෙත්ම කැත නොවූවා ය. එතරම් කථා නොකලා ය. බොහෝ සිහින දුටුවා ය. ඒ සියල්ල වම් කෝෂිකාවට යටින් තැන්පත් කර ගත්තා ය. අනායාසයෙන් ම. ඇයටත් නොදැනී.

ඔහු.
අඩි පහයි අඟල් නවය හමාරක් උස වූයේ ය . රෙඩි මේඩ් කමිස ඇන්දේ ය . එහෙයින් පපුව හා උදරයේ මිම් නොදත්තේ ය.

ඔවුහු.
වර්ණයෙන් තළෙළු වූහ . වීර කථාවක් අවසානයේ පෙම්වතුන් වූහ . බස් රියක් පසුබිම් කොටගත්. සෙනඟ පිරුණු දිනයක. සරමක් ඇඳි මහල්ලෙක් දුෂ්ඨයෙක් වුණ . සිය වම් අතින් ඇගේ ඩෙනිමේ ඝනකම සොයන්නට ගිය.

ප්‍රේමය.
දකුණතේ සුලැඟිල්ලෙන් ඇරඹී මහා ප්‍රාචීරය ආසන්නයේ බොහෝ කලක් සිරවී සිටියේ ය . අනතුරුව වම් පයේ සුලැඟිල්ලෙන් බැස ගියේය . උද්‍යානයට පොලිසියෙන් පැන පැය අසූ හතකට පසු.

එතැන් සිට.

ඔහු කථාව අඩු කලේ ය . ඇය ගේ කථාවද අඩු කරමින්. ඒ වෙනුවට. ඩෙනිම් වල බර කිරන්නට වැඩි කාලයක් වෙන් කලේ ය . ඩෙනිමක් වෙන්නට යත්න දැරී ය.

ඇය මැටි අච්චුවක් වූවා ය . හැරෙන නැවෙන දිගහැරෙන. නමුත් ප්‍රතිචාර නොදක්වන . පසුව බෝනික්කියක වූවාය. තිරසට තැබූ සැනින් නෙතුපියන.

ඔහු.
නොසන්සුන් වෙමින් සිටියේ ය.
බෝනික් නිමේශයන් හිදී වඩා දහදිය වැගිරුවේ ය. හොඳම මිතුරන්ගේ කීමට පෙති බිව්වේ ය . රටඉඳි කෑවේ ය. බෝනික්කන්ට පන දෙන අයුරු ගැන පොත් කියෙව්වේ ය . අන්තර්ජාලය පීරා ඒ ගැන සෙව්වේ ය. කථාව තවත් අඩුකලේ ය. කෘෂ වන්නට පටන් ගත්තේ ය.

---

අගුල.
වෙනදාට වඩා සියුමැලි අතකින් කැරකුණේ ය . වැසුණේය.

ඔහු මුලින් ඇඳ මත වැටුණේ ය . ඇය විසින් තල්ලු කරනු ලදුව. මෘදු ලෙස.

අනතුරුව ඇයට ඉඩදී බලා සිටියේ ය. සිය දෙපා හා දැත් ගැට ගසන තුරු. විශ්මයෙන් ප්‍රහර්ෂයට පත් වෙමින්.

ඇය.
මුලින් ඔහුගේ නාසය ඉම්බා ය. අනතුරුව ලවන්. ඉන්පසු බෝනිකි වෙස අත්හරිමින් බොහෝ දෑ කලා ය.

ඔහු.
සියල්ල අවසන් කලේ ය . වෙනදාට වඩා ඉක්මනින්. අතපය බැඳ තිබියදී ම.

ඇය.
ඔහුගේ දෑසට එබුණා ය. පපුව මත කඩා වැටුණා ය. දහදිය සේදෙන්නට තරම් හැඬුවා ය.

අනතුරුව හඬ අවදි කලා ය.
මුක්කන් ස්වරයෙන්.

" ඔයා දන්නවද? අද වැලන්ටයින්. මට තෑග්ගක් කෝ "

ඔහු. විපිලිසරව ගියේ ය.
නැතනී ය. අත ලිහාගන්නට යත්න දැරී ය.

ඇය. ඔහුව වැලැක්වූවා ය.

" වෙන තෑගි එපා. අද දවසම මාත් එක්ක කථා කර කර ඉන්න පුළුවන් ද ? "

# කෝච්චි සහ ස්වයංවරය.

සිල්පර. සම්පූර්ණයෙන් ම කොන්ක්‍රීට් නොවුණද දැවමය වූයේ ඉතා අඩු ප්‍රමාණයකිනි.

කාලයක් තිස්සේම දිරා ගියා වුවද මසටම කාවැදී තිබුණු ඇණ ද ලී සිල්පර අත නොහැර එල්ලීගෙනම සිටියෝ ය. ඇදෙමින්. තැලෙමින්. යලි නිසොල්මන් වෙමින් . කෝච්චියක් යන වාරයක් පාසා.

කෝච්චිය.

ඒ වන විටත් විනාඩි තුන හමාරක් ප්‍රමාදව තිබිණි.

මම.

දුරකථනය අතට ගෙන ඇගේ අංකවලින් එකකට ඇමතීමි.

ඇය එකවන ම ඇමතුම ට පිළිවදන් දුන්නා ය . කළබලයෙන්.

“ කොහෙද ඉන්නේ...?”

“තාම මඟ....!”

“මොකක්ද අනේ ...! දැන් මඟුල් ඇතත් සරසලා ඉවරයි...! තව ටිකකින් පටන් ගනියි...!”

“ඉස්සරහ හන්දියෙ කිඹුලෙක් හැප්පිලා ...! එතනින් එහාට බස් එන්නෙ නෑ”

“ඉතිං දැං ඔයා මොකේද එන්න යන්නේ...!”

“කෝච්චියෙ...”

“කෝ....ච...චි...යේ...?”

“ඔව්...! එතකොට ඉක්මනට එන්න පුළුවන්”

“ අනේ .... මං කෝච්චිවල ට බයයි....! කෝච්චි වල එන කුමාරයන්ටත් බයයි...! දිගට දිගේ.....! ඩකස් ඩොකස් ගාගෙන....”

“ඉතිං එහෙම වුණොත් මට වෙලාවට එන්න බැරි වෙයි...!”

“ කමක් නැහැ . කොහොම වුණත් මං ඔයාගෙනෙ....! අනේ කෝච්චියෙ නම් එන්න එපා හරිද.....?”

ඇය දුරකථනය විසන්ධි කළා ය . මුල් කළබලයෙන්ම.

.......................................................................

බසය. කිඹුල් මළකුණ මඟහැර ගමන් කල හෙයින් ගමනට අවුරුදු එකහමාරක් ගතවී තිබිණි.

මාලිගාව ඉදිරිපස. කුලියට දීමට තිබේ යනුවෙන් ලියූ පුවරුවක් විණි . අළුත් තීන්තෙන් . පැරණි ලෑල්ලක.
මිනිස්සු. කිසිවෙක් කොහේවත් නොසිටියහ.

මම. ආපසු යන දුම්රියට නැඟුණෙමි .

.................................................................

හරස් ගේට්ටුව. දුම්රියට පමණක් ඉඩ දෙමින් අවලම්බනය වෙමින් සිටියේ ය . වාහන වලට එදිරිව.

සුදු පැහැති සැප රිය. වාහන පෙළෙහි තුන්වෙනුව තිබිණි. රෝද නැවතී. එන්ජිම ක්‍රියාත්මකව.

ඇය. සැප රිය තුලට වී කෑ ගසමින් උන්නාය.
විසල් කොටගත් නෙත් තදින් වසාගෙන .
දෝතින්ම දෙසවන් බදාගෙන.

ස්වයංවරය. කලක ට පෙර අවසන්ව තිබිණි.

# අත් සහ මාංචු.

සභාපතිතුමා ත්‍රී වීල් චන්දරේට පයින් ගසා ඇති බවත් ඔහුගේ දකුණු උරහිස සපා කෑ බවත් කීවේ රන්සිරි මාමා ය.
ඕඅයිසී මහත්තයා යකෙකුට වත් බයනැති බව ත් කෙලින් වැඩකරන බවත් ඒ නිසා කෙලින්ම ගොස් සභාපති තුමාව කුදලාගෙන ගොස් කූඩු කර ඇති බවත් නලින් අයියා කීවේය.

ඒ සතියේ ම. චන්දන සමන් සමඟ පැටළුණේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස මූණ දම් වෙන්නට ගුටි කෑවේ ය. කමිසය ඉරාගත්තේ ය. දතක් කඩා ගත්තේ ය. කැඩුණු දත් කෑල්ල අතින් ගෙන ගෙදර ආවේ ය.
අම්මා. චන්දනව අතින් ඇදගෙන පොලිසි ගියේ ය. කැඩුණු දත් කෑල්ලත් සමඟ ම.
ඒ ඕඅයිසී මහත්තයා සිටි පොලිසියට ම.

ඕඅයිසී මහත්තයා කථාව අසා සිටියේ ය. සමන් හා පවුලම ගෙන්නුවේ ය. ඒ කථාවත් ඇසී ය.
" පොඩි උන්ගෙ රණ්ඩුවක්" කියා සමාදාන කළේ ය.

දවස් හතරක්.
ඉස්කෝල හන්දියේ සිට දේවාල පාර දක්වාත් කළුවාගේ පොට් එකේ සිට අශෝකාරාමය දක්වාත් මාතෘකාව වූයේ සභාපතිතුමාය.
චන්දන ගෙදර ගියේ ය. අම්මා සමඟ. බැනුම් අසමින්. අම්මාගෙන්.

වෙන කිසිවෙක් චන්දන ගැන කථා නොකළෝ ය.

පස්වන දවස.
සභාපතිතුමා ගෙදර ආවේ ය. නිදහස් ව.
චන්දන පාසල් ගියේ ය. වෙන දා මෙන් ම.

සභාපතිතුමා ප්‍රජා සත්කාර කළේ ය. ඔල්වරසන් ලැබී ය.
චන්දන විභාග අසමත් වූයේ ය. බැනුම් ඇසී ය.

මාස විසි හයකින්.
සභාපතිතුමා මහ චන්දයට ඉල්ලී ය. දිනුවේ ය. මන්ත්‍රීතුමා වූයේ ය.
චන්දන බදාම සැපයී ය. මේසන් බාස් වරුන් ට. ටිකක් බිව්වේ ය. හවස ට.

මන්ත්‍රීතුමා.
චූදිතයකු වී ය. නඩුවක. ස්ත්‍රී දූෂණයක් ගැන.

අත්අඩංගුවට පත්වී ය. රිමාන්ඩ් වී ය. උපවාසයක් ඇරඹී ය. බොරු චෝදනාවලට එරෙහිව.
අත එසවී ය. ආචාර කළේ ය. කැමරාවලට. පැමිණි වාර්තාකරුවන් අත වූ.

චන්දන.
කළුවාගේ දුවගේ පපුව අත ගාන්නට ගියේ ය. පදම වැඩිවූ දිනක.
බැනුම් ඇසී ය. ගුටි කෑවේ ය. සිහිසුන්ව ඇද වැටුණේ ය. කළුවාගේ නිවස ඉදිරිපස කාණුවට.
යලි සිහි ලැබීය. නැගිට ගත්තේ ය.ගෙදර ගියේ ය.

මන්ත්‍රීතුමා අතවනනු දිටී ය. ගෙදර යන ගමන්. නන්දෙ අයියලාගේ රූපවාහිනීය තුළ.

සති එක හමාරක්. මන්ත්‍රීතුමා ගැන කථා කළෝ ය. පත්තර ද රේඩියෝ ද රූපවාහිනී ද මිනිස්සු ද. චන්දන ගැන එහෙමට කථාවක් නොවී ය. දුටු තැන බැනුම් නම් වී ය.

එකොළොස්වෙනි දවස.
මන්ත්‍රීතුමා නිදහස් වී ය. සාක්ෂි නැති හෙයින්.
චන්දන වැඩට ගියේ ය. නින්දා නොලබා ම. අමතකව ගිය හෙයින්. මිනිසුන් ට.

මාස අට හමාරකින්.
මන්ත්‍රීතුමා ඇමති පදවියක් ලැබී ය . මාධ්‍ය සාකච්ඡා විසිතුනක් තැබී ය.
චන්දන බාස් වැඩයට අත තැබී ය. ගෙවල් තුන හමාරක් කපරාරු කළේ ය.

ඇමතිතුමා ගමට ගියේ ය. අලුත් නිවසට. අමුත්තන් පිරිසක් කැටිව.
චන්දන සීගිරි ගියේ ය. ඉයුජිනිස් මාමාගේ නඩය සමඟ. ඉහලට නැග්ගේ ය. ගිනි ගහන අව්වේ.

ඇමතිතුමා.
සෝඩා පමණක් බිව්වේ ය. අමුත්තන් විස්කි බොද්දී.
දඹරන් පිළිමයක් ටීපෝව මත විය. ඇමති තුමා හා අමුත්තන් අතර. විස්කි බෝතලයට වඩා උසට.

චන්දන.
නතරවූයේ ය. කැටපත් පවුර අසල.
වටපිට බැලී ය. සාක්කුවට අත දැමී ය. ඇණයක් ගත්තේ ය. කුණු හරුපයක් ලීවේ ය. කැටපත් පවුර මත.

මිනිස්සු. කුලප්පු වූහ.
ආරක්ෂකයෝ. දිව ආහ.

චන්දන. එතැනින් පැන ගත්තේ ය . සීගිරි ගල ඉහළට ම දිව්වේ ය.
වලකන්ට ආවුන් තල්ලුකරමින් හපමින් සහ ඇණයෙන් සූරමින්.
නැවතුණේ ය. ගල ඉස්මත්තේ.
හැරුණේ ය. එළවා ආවුන්ට මුහුණ ලා.
හති ලමින්.

අඩියක් පිටුපසට ගියේ ය. කෑ ගැසී ය.
" ආවොත් පනිනවා"

පොලිස් කණ්ඩායම් දෙකක්.
මුලින් පැමිණියේ ඇමතිතුමාගේ ගෙදරට ය.
අනතුරුව සීගිරි ගල මුදුනටය. විනාඩි තිස්තුනක පරතරයකින්.

චන්දන එතැන ම සිටියේ ය. ගල අග්ගිස්සේ.
ළඟට එන උන්ව බිය කරමින්. කෑගසමින්.
නොසන්සුන් ව. සන්සුන් වෙමින්.
එකවරම ඉදිරියට ආවේ ය. පොලිසියට බාර විය.
පඩි බසිමින් පහලට ආවේ ය. සීගිරියෙහි.

ඇමති තුමා කලබල වූයේ ය.
දුරකථන ඇමතුම් ගන්නට තැනී ය.
කුණුහරුපෙන් බැන්නේ ය. පුටුවක වාඩි ගත්තේ ය. හතිලෑවේ ය.
පොලිසියට අවනත විය. පඩි බසිමින් පහලට ආවේ ය. විසල් නිවසෙහි.

මිනිස්සු. පහල සිටියෝ ය. දෙතැන ම.
කැමරා ඇටවී තිබිණි. දෙපොලේ ම.

ජීප් රථ. දෙකක් විය.

දෙදෙනාම ඇවිද ගියෝ ය.
ජීප් රථ දෙසට.
ආපසු හැරුණෝ ය.
කැමරා දෙසට.

ඇමතිතුමා.
සිනාසුනේ ය. " කුමන්ත්‍රණයක් !" යැයි කීවේ ය.
චන්දන.
විරිත්තී ය. " ජයවේවා !" යැයි කීවේ ය.

සිනාසුණෝ ය.
අත් ඉහළට එසවූවෝ ය.
මාංචු පිටින්. දෙදෙනාම.

මාංචු.
එකම යකඩින් තනා තිබිණි. යතුරු පමණක් වෙනස් ව.

# රතු සහ කළු.

ලක්මිණි.
කාක නිල්පැහැ නෙත් යොමා ඉදිරිපස කාමරය දෙස බැලුවා ය. අන් අයට නොදැනෙනසේ.
කාමරයේ දොර වසා තිබිණි. දොරට ඉදිරියෙන් සෝපාවක් විණි. ආනයනය කරන ලද.
සෝපාව මත. කිසිවක් නොතිබුණේය. කිසිවෙක් නොසිටියෝ ය.

ලක්මිණි.
සිය මේස ලාච්චුවෙහි වූ තුවාය ගත්තා ය. සුදු පැහැ. අඩි එකහමාරක් දිග. අඟල් දහඅටක් පළල.
නැගිට්ටා ය. ලැසිගමනින් ඇවිද ගියා ය. සේදුම් කාමරය වෙත. බිත්ති කොනක වූ කැමරාවට පිටුපා.

සේදුම් කාමරය මැද සිටගෙන සිටියා ය. දිග කණ්නාඩියෙන් සිය රුව බලමින්. පිටෙහි එතී ගිය රතු පැහැ බ්ලවිසය සකසමින්. වටොර මත රැළි වැටුණු කළු පැහැ කලිසම නිවැරදි කරමින්.

මුහුණ සේදුවා ය. තුවායෙන් ළැම වසාගෙන. වතුර වැටෙතැයි බියෙන්. මුහුණ පිස ගත්තා ය. ඉදිරියට නවාගෙන. දියබිඳු බිමට වැටෙන සේ.

තොල් ආලේපන ගැල්වූවා ය. රතු පැහැ කූරක් කලිසම් සාක්කුවෙන් ගෙන . තොල් ගිලගත්තා ය. ආලේපය සමව පැතිරෙන සේ. යළි දිගහැරියා ය.
දුඹුරු පැහැ පැන්සලක් ගත්තා ය . කළු පැහැ තුඩක් ඇති. දෙතොල මායිම් ලකුණු කළා ය.

යළිත් කණ්නාඩියෙන් සිරුර බැලුවා ය . මුහුණ බැලුවා ය. අවුල්ව ගිය කෙස් සකසාගත්තා ය.

සේදුම් කාමරයේ දොර හැරියා ය . ලැසිගමනින් ඇවිද ආවා ය. තම අසුන වෙත. බිත්තියෙහි වූ කැමරාවට මුහුණ ලා.

දොර විවර වූයේ ය. කාමරය තුළ වූ අමුත්තෝ පිටවූයෝය.

ලක්මිණී.
කලින් සකසාතබාගත් ලිපි ගොනුව අතට ගත්තා ය. ඉක්මන් ගමනින් කාමරය වෙත ගියා ය. ඊට පිටින් නැවතුණා ය. සෝපාවෙහි හිඳගත්තා ය. ඉදිරිපසින් වූ කැමරාවට ඉදිරියෙන්.
ඉදිරියෙන් වූ කෙටි මේසය මත ලිපිගොණුව තැබුවා ය. කැමරාව දෙස හොරැහින් බැලුවා ය. කළු පැහැති කලිසම සැකසුවා ය. තත්පර නවයක්. රතු පැහැති බ්ලවුසය සැකසුවාය. තත්පර දහඅටක්.

නැගිට්ටා ය. දොර වෙත ගියා ය. තෙවරක් තට්ටු කළා ය. මැදඟිල්ලෙහි දෙවෙනි පුරුකින්.

බොස්.
දකුණු පස වූ පරිගණක තිරයෙන් ඇස් ඉවතට ගත්තේ ය. ඉදිරිපස වූ ලැප්ටොප් පරිගණකය කරකැවී ය. දකුණට. අංශක අනූවක්. ඉන්පසු තල්ලු කළේ ය. දකුණටම. අඟල් පහළොවක්.

හිස එසවී ය. තරමක් බැරෑරුම් මුහුණක් හදා ගත්තේ ය.
“ කම් ඉන්" යැයි හඬ නැඟී ය.

ලක්මිණී.
දොර විවර කළා ය. ඇතුලට ආවා ය. ආපසු හැරුණා ය. දොර අගුල් දැමුවා ය.
සිනාසීගෙන බොස් දෙස හැරුණා ය.

බොස්.
“ වාව්...! රෙඩ් ඇන් බ්ලැක් ලේඩි...! වට් අ නයිස් සිලෙක්ෂන්...!” කීවේ නැත.
“ යර්ස් ලක්මිණී.....! වට් ඊස් ද මැටර්...?” යැයි ඇසී ය.
වෙනසක් නැතිව ම. රාජකාරි ස්වරයෙන් ම. වෙනත් සේවකයකුට කථා කරන්නාක් මෙන් ම.

ලක්මිණී.
තරමක් පසුබා ගියා ය. පැකිළුණාය. වික්ෂිප්තව මෙන් බොස් දෙස බැලුවා ය.

බොස්.
ලක්මිණී පත්ව සිටි අපහසුතාවයෙන් බේරා ගත්තේ ය.
“ ෂෝ මී ද ෆයිල් ....?”

ලක්මිණී. සිය අතෙහි වූ ලිපි ගොනුව බොස් වෙත පෑවා ය.

බොස්. ලිපිගොණුව පෙරළී ය. හිස් පිටුවක් ළඟ නැවතුණේ ය. හරහට ඉරි හතරක් ද දිගට ඉරි තුනක් ද ඇන්දේ ය. ඒවා එකිනෙක යා කළේ ය. සිග් සැග් රටාවකින්.

“ කරෙක්ට් දෙම් ඇන්ඩ් බ්‍රින්ග් මි බැක්....!”
වෙනසක් නැතිව ම. රාජකාරි ස්වරයෙන් ම. වෙනත් සේවකයකුට කථා කරන්නාක් මෙන් ම.

ලක්මිණී.
ලිපිගොණුව ගත්තා ය.
ආපසු හැරුණා ය.
දොරෙහි අගුල් හැරියා ය.
දොර හැරියා ය.

කාමරයෙන් එළියට ආවා ය.
ඉක්මන් ගමනින් තම මේසය වෙත ආවා ය.
මුහුණ කළුව. නෙත් රතුව. තනිව දොඩමින්.

---

බොස්.
පරිගණකය තමා වෙතට ඇද ගත්තේ ය. අංශක අනූවක් කැරකීය. වමට.

තිරයට උඩින්වූ කැමරාවට එබුණේ ය.
" දැන්වත් විශ්වාස ද එක එකා කියන කථා බොරු කියලා.....!"

අනතුරුව පරිගණකය වසා දැමී ය. දුරකථනය අතට ගත්තේ ය. රිසීවරය කනෙහි තබාගත්තේ ය. අංක තුනක් එබී ය.

අනෙක් පසින් ප්‍රතිචාර ලැබෙත් ම.
" වාව්...! රෙඩ් ඇන් බ්ලැක් ලේඩි...! වට් අ නයිස් සිලෙක්ෂන්...!" යැයි පැවසී ය.

වෙනස්ව. සෙනෙහෙන් බරිතව. ඇයට පමණක් විශේෂ ව.

# තුන්වෙනි සීනුව.

ශාලාව තුළ. අඳුර පිරී තිබිණි. වහල මකුළු දැලින් ගහනව.

පිටින්. ශාලා මිදුල වල් බිහිවී තිබිණි . බොහෝ කලකින් මිනිසුන් නොපැමිණි සේ ය.

මෙහි අවසන් වරට මහ සෙනඟ රැස් වූයේ මීට බොහෝ කළක ට ඉහතදී ය. ඒ ද සුපුරුදු පරිදි නාට්‍ය දර්ශණයක් හෝ වෙනයම් කලා කටයුත්තක් සඳහා නොව ටියුෂන් ගුරුවරයෙකු ගේ සම්මන්ත්‍රණයක් සඳහා ය.

නමුත් ප්‍රධාන නගරයේ සිට තරමක දුරින් පිහිටි නිසාදෝ සම්මන්ත්‍රණ සඳහා ද ශාලාව භාවිතා කිරීම නතර විණි. අවසන සියල්ලන්ට ම අමතකව ගිය ශාලාව ඉතා සතුටින් සොබාදම් මාතාව වැළඳ ගත්තේ ය.

නමුත් ශාලාවට පාළු නොදැනුනා නොවේ . නිදිවර්ජිත රාත්‍රීන් පුරා තම සිරුර තුල දෝංකාර දෙන දෙබස් එය විසින් මෙනෙහි කෙරුණේ ය . ගරු ගාම්භීර. යටහත් පහත්. ශාන්ත. ප්‍රේමණීය. අවලම්.

අවසන එක් අයෙකු ආවේ ය . බොහෝ දැ ඩැගෙන.

ඒ සියල්ල වේදිකාවේ පසෙක පිළිවෙලින් තැන්පත් කලේ ය. ඉන්පසු හොඳින් නිදාගත්තේ ය. පුටු කිහිපයක් එකට කර යහනක් තනාගෙන එය තුලට වැටී.

ශාලාවට සතුටක් දැනුණි.
නාට්‍යයක් විය හැකි ය. නමුත් අනිත් අය ?

ප්‍රශ්නයක් නැත. සාමාන්‍යයෙන් නාට්‍ය පුහුණු වීම් වලට ශිල්පීන් වෙලාවට එන්නේ ම නැත. ඔවුන් මඟ එනවා ඇත. ශාලාව බලා සිටියේ ය.

බෝ වේලා ගතවිණි. අමුතුවෙන් කිසිවකු පැමිණියේ නැත . මුල් අමුත්තා නින්දෙන් ඇහැරුණේ ය. ඇඟමැලි කඩමින් නැඟිට්ටේ ය . වටපිට බලා සෘජු ව සිට ගෙන කටහඬ අවදි කළේ ය.

“සුබ සන්ධ්‍යාවක්. මම රුවන්"

ශාලාව ප්‍රීතියෙන් පිම්බුණේ ය . නාට්‍යකරුවන් අනන්තවත් ඔවැනි දෑ කරන්නේ ය.
මේ නාට්‍යකරුවෙකි.

නමුත් රුවන් ශාලාව හිතූ තරම් දක්ෂ නාට්‍ය - කරුවෙකු නොවී ය.
දෙබස් කියන්නේ ය. තනිවම. බෙරිහන් දෙන්නේ ය. වියරු හුන් අයෙකු මෙන් . ඔහේ ශාලාව පුරා ඇවිදින්නේ ය.
කිසිදු සංයමයකින් තොරව.

කලබල විය යුතු නැත . මේ ලැලි මතදීම ඔහු පරිපූර්ණ නළුවෙකු වනු ඇත.

උදෑසනම රුවන් ශාලාවෙන් පිටවී ගියේ ය . දින තුනකට පසු.

මේ වනතුරු යළි නාවේ ය.

ලෙන තුල නොවෙ ති. පෙරලා නො එති.
නමුත් අවසානේ ගෝඩෝ උන්නැහේ ආවේ ය . පෙස්සෝ ආදි හූ ඔහු එන තුරු බලා නොසිටිය ද ඔහු ආවේ ය.

ශාලාවේ එක් දොරටුවක අඟුල කරකැවිණි . ශාලාව ඉමහත් උද්දාමයට පත් වී ය . සිහි නැති වන තරම්.

ශාලාවට සිහි එළඹෙන විට රුවන් විදුලි බුබුලක් දල්වා තිබිණි. තමා රැගෙන ආ දෙය වේදිකාව මත තබා ගොස්.

ශාලාව තිගැස්සිණි.

වැදිරජු විසින් මනමේ කුමරිය පැහැරගෙන ය. මනමේ කුමරිය විසඳුව උන්නා ය.
ලා නිල් පැහැ ඩෙනිම් කලිසමකින් හා කළු පැහැ ටීෂර්ටයකින් සැරසී.

රුවන්. වේදිකාවෙන් බිමට පැන ප්‍රේක්ෂාගාරයට ගියේ ය. පුටුවක් රැගෙන යලි වේදිකාවට නැංගේ ය. පුටුව මනමේ කුමරිය අසලින් තබා කඹයක් සොයා ගත්තේ ය. තම පරණ ලට්ටලොට්ට අතරින්.

කඹයේ එක් කොණක් පුටුවේද අනෙක් කොණ මනමේ කුමරියගේ දෑතේද බැන්දේ ය.

ශාලාවට ඉමහත් සතුටක් දැණිනි.
පුදුමාකාර කඩිසර කමකි. ඔවුහු පැමිණි විගස පුහුණුවීම් අරඹා ඇත්තා හ. එක වදනක් හෝ වැය නොකර.

මනමේ කුමරිය පුටුවේ දිගේලි කල රුවන් අනතුරුව වතුර වීදුරුවක් ගෙන ඉන් මඳක් ඇගේ මුහුණට ඉස්සේ ය.

දැලි පිහියක් හා දැලි පිහි මුවහත් තබනයක් ගෙන දැලි පිහිය මුවාත තබන්නට වූයේ ය.
වීදුරුවේ ඉතිරි වතුරෙන්.

මනමේ කුමරිය සිහි ලැබුවා ය.
මඳක් ඉදිරියට ආවා ය.
පුටුව. පෙරලිණි.
ඇය බැඳ සිටි ලණුව හේතුවෙන්.

පුටුව පෙරලුණු හඬ ඇසුනද රුවන් ඒ දෙස හැරී නොබැලී ය.
හිටිවනම හිඳ හඬ අවදි කළේ ය. පිහිය මුවාත් තබමින් ම.

"පුංචියට හිටියට සැහෙන්ඩ බර යි. ඇටකටුවල කැල්සියම් වැඩිපුර ඇති මගෙ හිතේ."

මනමේ කුමරිය. විමසිලිමත් වූවා ය. බැම්මෙන් මිදීමට අසාර්ථක උත්සාහයක නියැලුණා ය. පිටුපසට කොට ඇති සිය දෑත සොලවමින්.

අසාර්ථක වූ තැන පුටුවද ඇදගෙන ම ගොස් රුවන් ගේ මුහුණට එබුණා ය . ඒ සැනින් බියපත්ව ආපස්සට පැන්නා ය.

රුවන්. නැඟිට ගොස් පුටුව කෙලින් කළේ ය. ඇය ගැන මඳ තැකීමක් වත් නොකොට . අනතුරුව ආපසු හැරීවිත් මනමේ කුමරියගේ උරට අතක් තැබී ය. ඕ සැනෙකින් ඉවත් වූවා ය.

“ අල්ලන්න එපා මාව ................ වනවරයා !!!”

ශාලාව දෙදරා ගියේ ය.
මනමේ කුමරිය මෙබඳු දෙබස් නොකියන්නී ය. එසේ නම් මැය කවුරු විය හැකිද ? චිත්‍රාණී, චන්ද්‍රාවතී, හෙලන්, එසින්ග්මා, දෝන කතිරිනා ..... ශාලාව තමා දන්නා කාන්තා චරිත මේ චරිතය හා සසඳන්නට යත්න දැරී ය . මේ වේදිකාව මත රඟ දැක්වුණු සියලු කාන්තා චරිත.

අවසානයේ දී ඇය කවුදැයි දැනගන්නා තුරු ඇයට ඇය කියා ඇමතීමට ශාලාව තීරණය කළේ ය.

රුවන්ගෙන් ඉවතට පිනූ ඇය නොනවත්වා කතා කළා ය. චෝදනා ස්වරයෙන්.

“ සොරි කියපු විදිහට මං හිතුවෙ වැදගත් මහත්තයෙක් කියලා"

රුවන් මහහඬින් සිනාසෙන්නට වූයේ ය . වෑයමෙන් සිනාව නවතා ගත්තේ ය.
“සොරි කියන හැමෝම වැදගත් මහත්තුරුද?”

ඇය පිළිතුරක් දී ගත නොහී පැකිලුණා ය . ස්ටැනිස්ලාවුස්කි රංග රීතියෙහි මනා පරිචය ස්ඵුට කරමින්.

රුවන් යළි දැලි පිහිය ගෙන මුවහත් තබන්නට වී ය.

" තමුසෙ මොකටද මාව මෙහාට අරන් ආවෙ?”

“ඒ බස් එකේ නැගලා කොහේද ගියේ?”

එවර ඇය හඬ  උස් කළා ය.
“තමුසෙ මොකටද මාව මෙහාට අරං ආවේ?”

“ ඔයා හිනාවුණ නිසා"

ඇය විශ්මයෙන් දෙබැම එසවූවා ය.
" මං හිනාවුණ නිසා ??”

“ඔව් ඔයා හිනාවුණ නිසා"

“ඉතිං එහෙම හිනාවෙන හැමෝම මෙහෙම ගේනවද?”

රුවන් පිළිවදන් දුන්නේ ය. ශාන්ත ස්වරයෙන්.
“ඒක තීරණය වෙන්නේ පතාගෙන ආව විදිහට, එහෙම නැත්තම් පෙර භවයන් වලදී කරපු කුසලාකුසල ධර්ම වලට අනුකූලව"

මේ කැහැටු ඉලන්දාරියා පසුගිය දින කිහිපයේ දී ලබා ගෙන ඇති දියුණුව ගැන ශාලාව ප්‍රීතියට පත්වූයේ ය. එයට මහහඬින් අත්තල ගසන්නට පවා සිතුණි.

" ඒ කියන්නේ මේක මගේ අකුසලයක්?"

"අකුසලයක්?"
රුවන් සිය චරිතයට උපරිම සාධාරණත්වය ඉටුකරන්නේ ය. ශාලාව නිවැරදි ය. මේ ලෑලි කිසිවකුට වරද්දන්නේ නැත.

"ශාස්තෲවරයෙක් ගෙ පළවෙනි ශ්‍රාවකයා වෙන්න කොච්චර කුසල් කරන්න ඕනිද?"

ගැටුම.
නාට්‍යක් ඉදිරියට ගෙනයෑමට අත්‍යාවශ්‍ය ය.

"ඉතිං ඔහේ ශාස්තෲවරයෙකුත් නෙවෙයි.
මං ශ්‍රාවකයෙකුත් නෙවෙයි"

රුවන් සිනාසෙන්නට වී ය . ක්‍රමක්‍රමයෙන් උස්වෙමින්. ශාලාව ඔහුට උදව් කළේ ය. එම සිනා හඬ ප්‍රතිරාව නංවමින්.

රුවන්. සිනාව නැවැත්වී ය. කථාව ඇරඹී ය.
"බුදුහාමුදුරුවෝ ඉසිපතනෙට ගිය වෙලාවෙ... පස්වග තවුසො කතා වුනාලු, ඔන්න එනවා ෂූවර් එකටම බුදු වෙලා නම් නෙවෙයි කියලා.."

ඇය. නෙත් වලින් බිණීමෙහි හපනියක් බව ශාලාව සටහන් කර ගත්තේ ය.
"තමුසෙ මොකෙක් ද?"
ඇය අවිශ්වාසය දෙනෙතට නඟා ඇසුවා ය.

"ජීව විද්‍යාත්මක වර්ගීකරණය අනුව හෝමෝ සේපියන්ස් සේපියන්ස් කියන වානර කොට්ඨාසයට අයත් පිරිමි සතෙක් . නැත්තම් ශුක්‍රාණු දායකයෙක්"

" මාව ගෙනාවේ මට බලහත්කාරකම් කරන්න ද?"

“ බොහෝම කෘතඥගාවුයි............... ඒකට නෙවෙයි"

ඇය විපිලිසර වූවා ය. ශාලාව ඇහුම්කන් දීගෙන සිටියේ ය.

“එහෙනම් කප්පම් ගන්න ද? ඒත් මං වෙනුවෙන් කප්පම් ගෙවන්න කවුරුත් නෑ නේ"

රුවන් නිහඬ ය. ඇය නොඉවසිල්ලෙන් බලා සිටියා ය.

වෙලාව ගත වේ. ප්‍රේක්ෂාව බිඳී යා නොදිය යුතු ය. දැන් කුමක් හෝ සිදුවන්නේ නම් මැනවැ යි ශාලාව සිතී ය. ඒ සමඟම ඇ හඬ අවදි කළා ය.

“අනේ මගේ ළඟ තියෙන මේ ඔක්කෝම ගන්නව. මුදු මාල වළලු අරුංගල් ...........”

රුවන් නිහඬ ය.

ඇය බැගෑපත් වූවා ය.

“දන්නව මීයක් කඩන්නේ අත ලෙව කන්න නෙවෙයි කියලා. ඒ වුනාට මං ළඟ තියෙන්නේ මෙච්චරයි.”

රුවන් එකවරම ඉදිරියට පැන්නේ ය.
ඇයව ඔසවාගෙන පුටුව මත තදින් ඉන්දෙව්වේ ය.

අනතුරුව ආවේගයෙන් දෙඩී ය.
නැත. කෑ ගැසුවේ ය.

“මං මොකෙක් කියලා හිතුව ද? මං තමුසෙව ගෙනාවේ තමුසෙගෙ ඉන ඉහ අතගාගන්න කියලා හිතුව ද? බලනව බලනවා........ මාව පේන්නේ හොරෙක් විදිහට ද ? නැත්තම් ස්ත්‍රී දූෂකයෙක් විදිහට ද?”

හතිලෑවේ ය.

" හෝව්..............................නෑ ................එපා...................... කෙනෙක් දිහා පිටින් බලලා එයාව අඳුරගන්න බෑ...."

ඇය භීත වී බලා සිටියා ය.
රුවන් සන්සුන් ගමනින් ඈ වෙත ගියේ ය.

මොහු භාවයකින් භාවයකට කෙතරම් දක්ෂ ලෙස මාරු වන්නේ ද ? ශාලාව සතුටින් යුතු ව බලා සිටියේ ය.

රුවන් ඇය ව නැගිට්ටුවේ ය. දෑතින්ම. ඇගේ මුහුණ මැදි කරගෙන.
" ඇයි මාව තරහ ගැස්සුවේ. මං කොහොම ද ඉවසන්නෙ ඔයා මං ගැන ඔහොම හිතනකොට........."

ග්ලිසරීන්... යමෙක් එය නොමැති ව කඳුළු සැලීමෙහි සමත් නම් එය වැදගත් දෙයකි. දැන් ඇයගේ දෑසින් කඳුළු කඩා හැලේ.

රුවන් ඇගේ දෑසේ කඳුළු පිස දැමී ය. අනතුරු ව ඇගේ දෑසට එබී බලා මඳක් වේලා සිටියේ ය . ඇය යලිත් හඬන්නී ය. රුවන් ඇය පුටුවේ හිඳුවා ඉවත ගියේ ය.

ඉවත යමින් දෙඩී ය.
" හුඟාක් දෙනෙකු ට තේරෙන්නෙ නෑ. එහෙමත් නෙවෙයි. තේරුම් ගන්න උත්සාහ කරන්නෙ නෑ. අපි මොකට ද ජීවත් වෙන්නේ ? - මේ ලෝකෙට ඉපදුණු නිසා. - ඉතිං ජීවත් වෙන එක කරදරයක් නම් ඒකෙන් බේරෙන්න එපා යෑ"

ඔහු පිළිතුරක් බලාපොරොත්තු නොවන බව පැහැදිලිවම පෙනුණි.
නමුත් සිහින් කෙඳිරියක් ඔහුට පිළිවදන් දුන්නා ය.
"ඒ වුනා ට ජීවිතේ රස විඳින අයත් ඉන්නව"

රුවන් වේදිකාවේ වම්පස අන්තයට ගමන් කළේ ය. ගමන් කරන ගමන් නොනවත් වා කියවී ය.
"සැප....................සැප.....................සැප........... සැප.... ........"

මේ අතර ඇය තම බැමි ලිහා ගැනීමට යළිත් වරක් යත්න දැරුවා ය. මහ හඬක් නංවමින් ඇද වැටුණා ය. පුටුව ද සමඟ.

"දුක"
රුවන් එකවරම ආපසු හැරුණේ ය . ඇය වෙත ආවේ ය.

" දන්නවද? හැම සැපතකටම මුල් වුණ හේතුවක් තියෙනවා. මුල් විනාශ වුණ ගමන් ගහ මැරිලා යනවා"

ශාලාව දෙදරා ගියේ ය. ඒ එම දෙබස අවසන් වනවාත් සමඟම රුවන් ඇයට එල්ලකල කම්මුල් පහර හේතුවෙනි.

රුවන් මෙම කම්මුල් පහර නිරූපණය සඳහා වෙනත් රංග විධි ක්‍රමයක් යොදා ගත්තේ නම් මැනවැ යි ශාලාව සිතී ය. පැහැදිලිව ම එම පහර ඇයට වේදනා දුන් බව පෙනුණ හෙයිනි.

“ වැදගත් දෙයක් කියද්දි අහන් ඉන්න දන් නෑ .. වෙන වැඩ "

ඇය කඳුළු පිරි නෙතින් යුතුව ඔහු දෙස බැලුවා ය. “මගේ අත් දෙක රිදෙනවා . මාව ගැට ගහලා තියෙන්නේ වල් සතෙක් ගැටගහනවා වගේ"

රුවන් කලබල වූයේ ය. ඔහු ඇගේ බැමි ලිහීමට උත්සාහ කළේ ය. අසාර්ථක විණි.
දැලි පිහිය ගෙන බැමි කපා දැමී ය . ඇය මඳක් දැඟලුවා ය. රුවන් ගේ ඇඟිල්ලක් තුවාල කරවමින්.

ඔහු වේදනාවෙන් නැගිට්ටේ ය . තුවාල ඇඟිල්ල අනිත් අතින් තද කොට අල්ලා ගෙන.

විශේෂ ප්‍රයෝග. මොවුන් එය දක්ෂ ලෙස භාවිතා කරයි. රුවන් ගේ ඇඟිල්ල පුරා රතු පැහැ දියරයක් ගලා යයි. මෙපමණ පළපුරුදු ශාලාවට පවා ඒ ලේ ම යැයි සිතුණි.

ඇය සසල වූවා ය. රුවන් ගේ බැල්මෙන්.
සැණෙකින් ප්‍රේක්ෂාගාරයට පැන්නා ය. බැම් ලිහී තිබූ හෙයින්.

රුවන් ඇය පිටුපස එලවා ගියේ ය . ඔවුහු බොහෝ වේලා ලුහුබැඳීම් සහ පලායෑම් කළ හ. පුටු අතර.

අවසානයේ ඇය පිටවීමේ දොරටුව අසලටම ගියා ය. ඒ සමඟ ම රුවන් පුටුවක හැපී ඇද වැටුණේ ය.

ඇය ආපසු හැරුණා ය.
රුවන් වෙත දිව ගියා ය.
මඳ වේලාවක් බලා සිට.

ඔහු ඇය ඔසවා ගත්තේ ය . දෙදෙනාම හිනැහෙමින් වේදිකාව වෙත ආවෝ ය. රුවන් ඇගේ හිසට සිහින් තට්ටුවක් දමා ඉවත ගියේ ය . ඇය පුටුව මත හිඳුවා.

දැලි පිහිය ගෙන එය මුවහත් තබන්නට පටන් ගත්තේ ය.

ඇය රුවන් වෙත ගියා ය. ගෙල වටා දෑත යැව්වා ය. පිටු පසින්.

“මාව මෙහාට ගෙනාවේ ඇයි?”

“මරන්න"

ඕ සිය උවන ඔහු වෙත පෑවේ ය.“ඉතිං මරන්න"

රුවන් ඇය වැළඳ ගෙනම දැලි පිහියේ මුවාත බැලී ය.
“ම්හු.................
...................... බෑ. පිහියෙ මුවාත මදි . ඔයාට රිදේවි "

ඇය ඉවතට පැන්නා ය. අවිශ්වාසයෙන් හඬ අවදි කළා ය.
“මාව ඇත්තටම මරනව ද?”

"අපි හැම තිස්සෙම බොරුවට මැරෙනව. ඊට පස්සේ ආයෙත් ඉපදෙනවා. ඉපදිලා බැලුවම ආයෙත් පරණ ලෝකෙමයි. ඔයාට කවදාවත් හිතිලා නැද්ද ඇත්තට මැරෙන්න?"

"ඔයා මාව මරනව ද?"

"හීනෙන්වත් ඔයා දැකලා නැද්ද  ඔයාට මිනී ඇඳුමක් අන්දලා.........."

ඇය කෑ ගැසුවා ය. ඔහුට බාධා කරමින්.
"තමුසෙ මාව මරණව ද?"

රුවන් ගොස් ඇයව වත්තං කර ගත්තේ ය. ඕ ඔහුගේ අත බදා ගෙන හඩන්නට වූවා ය.

"ඔයා මට ආදරේ නෑ"
"මං ආදරෙයි"
"එහෙනම් ඇයි මාව  මරන්න හදන්නේ?"

රුවන් ඇයගේ දෙනෙතට එබුණේ ය.

“ මේ ලෝකේ නපුරු වැඩියි . මං ආවෙ ඒ නපුරෙන් හොඳ මිනිස්සුන් ව බේරා ගන්න .ඔයා වගේ හොඳ කට්ටිය ඉන්නේ බොහොම ටිකයි . මං ඒ හොඳ කට්ටිය ව මරලා දැම්මම ඒ අය දිව්‍ය ලෝකෙකට යාවි.
ඉතිරි වෙන නරක උන් මේ ජරා වලේ ම දුක් විඳීවි. මැරි මැරි ඉපදේවි"

ඇගේ නෙතට අලුත් කාන්තියක් උනා තිබිණි.
“ ඔයාට මාව මරන්න ම ඕනිද?”

ඔහු අකම්පිතව හිස සැලී ය.

“මං අන්තිම ඉල්ලීමක් කරන්නද? මං මැරෙන වෙලාවේ ඔයාගේ කමිසෙ ඇඳගෙන ඉන්නද?”

ඔහු ඇයට සිය කමිසය ගලවා දුන්නේ ය . නිහඬව ම.

ඇය කමිසය අතින් ගත්තා ය.
ඒ අතින් දරාගනම බලවසයෙහි බොත්තම් ගලවන්නට වූවා ය.

රුවන් බලා සිටිනු දුටුවා ය.

"අහක බලා ගන්න මට ලැජ්ජයි"

රුවන් අනෙක් පස හැරුණේ ය.

ඉන්පසු සියල්ල ක්ෂණික හා තීරණාත්මක දේවල් විණි.

ඇය මඳ විපරමකින් පසු වේදිකාවේ පසෙක වූ දණ්ඩක් සොයා ගත්තා ය.

ඉන් රුවන් ට පහර දුන්නා ය.

වැරෙන්. හිස පිටුපසට.
සියලු ශක්තිය එක්කොට.

"හ්ග්" හඬක් පමනක් නැඟූ ඔහු වේදිකාව මත ඇද වැටුණේ ය.

ඇය ඉවතට දිව ගියා ය.
දොරටුව අසලට ගොස් යළි හැරී බැලුවා ය.

රුවන් වේදනාවෙන් හිස එසවී ය.
“බුදුහාමුදුරුවො දෙව්දත් ට කවදාවත් වෛර කලේ නෑ"

ඔහුගේ හිස කඩා වැටුණේ ය.

වේදිකාවේ ලෑලි මත ගලා යන්නේ රතු සායම් නොව ලේ බව ශාලාව හඳුනා ගත්තේ ය.

# මුදු සහ කෙස් .

බස් රිය. බොහෝ වලගොඩැලි මතින් උඩ පනිමින් ගමනාන්තය කරා දුවමින් තිබුණේය.

වලවල්. වැසිදාට වැසි දියෙන්ද අව්දාට හිරු රැසින්ද දිනපතා රෝදයන්ගෙන්ද පහර කමින් තම වපසරිය පුළුල් කරගනිමින් සිටියේය.

රියදුරු. එකවනම බසයේ තිරිංග තද කළේ ය. ඉක්මනින් හා තදින්.

ඇය. මගේ මඟුල් මුදුවේ පැටලී ගිය කෙහෙරොදක වාරුවෙන් නොවැටී සිටියාය . අනතුරුව සිනාසී යලි සිට ගත්තාය.

මුද්ද. කෙහෙරොද අතනොහැර අල්ලාගෙනම සිටියේය. නැත. කෙහෙරොදට මුද්දෙන් ගැලවීමට අනැවැසිව තිබිණි.

ඇය කෙහෙරොද කඩා දැමීමට යත්න දැරුවාය.
මම ඇය වැලකීමි.
මම මුද්ද ගැලවීමට යත්න දැරීමි. ඇය මා වැලකුවාය.

............................................................

කාමරය.
ඇගේ කෙස්වල ගැල්වූ සුවඳින් පිරී යෑමට තරම් කුඩා එකක් විය.

අපි මුද්දෙන් කෙහෙරොද මුදා හැරියෙමු . මගේ ළය මත ඇගේ හිස තියෙද්දී.
කෙහෙරොද නොකඩා. මුද්ද නොරිදවා.

මා සිවිලිම දෙස බලා සිටිද්දී ඇය මුද්ද දෙස බලා සිටියාය.

" රත්තරං... නේ ?"

මම සිනාසුනෙමි.

“ මට ටොක්කක් අනිනවද?”

මම ප්‍රශ්නාර්ථයක් දල්වා ඇය දෙස බැලීමි.

“ මං රත්තරං මුද්දක් දාපු අතකින් ටොක්කක් කාලම නෑ"

# කඩදාසි.

නිශාන්ත රත්නායක විසිකළ ගිනිකූර බිම පතිත වෙද්දීත් නිවී නොතිබුණ හෙයින් ක්‍රිෂාන්ත ඒකනායකගේ ඇඳ යට තිබූ විසල් කඩදාසි ගොන්න ගිනි ගත්තේ ය.

නිශාන්ත ගිනිකූර විසිකළ සැණෙන් කාමරයෙන් නික්ම ගිය හෙයින් ද ගින්න එකවරම ඇවිලී යනවා වෙනුවට මුලින් සුළුවට ඇරඹී පසුව පැතිරී ගිය හෙයින් ද සියල්ලටම වඩා ක්‍රිෂාන්ත ගින්න ඇවිල යද්දී ඒ දෙස බලාපොරොත්තුවෙන් බලා සිටි හෙයින් ද එය බැරැක්කයෙන් අඩක් පුරා පැතිරෙන තුරු ගින්නට විරුද්ධව නිසි පියවර ගැනීමට කඳවුරේ කිසිවකුට නොහැකි විය.

ගින්නට පෙර දුම දුටු සෙබළුන් සියල්ලෝ නිල විධානයක් පැමිණීමට පෙරම ගින්න නිවීමට දිව ගියෝ ය. එලෙස දිවගිය කිහිප දෙනකු බැරැක්කය තුළ සිහිසුන්ව සිටි ක්‍රිෂාන්තව දුටු හෙයින් ඔහුගේ ජීවිතය එවර බේරුණේ ය.

" මොකද එච්චර කඩදාසි ගොඩක් ඇඳ යට තියන් හිටියේ ?"

ඒ ප්‍රශ්නයට පිළිතුරු නොදී නිහඬව සිටීම ක්‍රිෂාන්තගේ ජීවිතයට කරදර වැලක් එක් කළේ ය.

.........................................................................

"ක්‍රිෂාන්ත කඩදාසි එකතු කරන්න ගත්තෙ ගිය මාසෙ අපි වින්ඩ්‍රෝ වෙලා ආවදා ඉඳන්"

" මිනිහ අපි එක්ක කථා කරන එකත් නැවැත්තුව"

" එයා සෑහෙන්න වද වුණා කුෂාන්ත ව අතෑරල එන්න වුණ එකට"

" මාත් එතන හිටියා. බංකරෙන් උඩට ඇදල ගන්නකොට එයාගෙ කකුල් දෙකම දණිස් ගාවින් වෙන්වෙලා තිබුණෙ"

" එක දිගටම රෙරාල ඇටැක් කරන් ඉස්සරහට එන්න පටන්ගත්ත නිසා අපිට කුෂාන්ත ව උස්සන් එන්න පුළුවන් කමක් තිබුණෙ නෑ"

" දැන් මනුස්සයගෙ ඒම් එකත් එච්චරම හරි නෑ . වෙලාවකට පිස්සෙක් වගේ"

" අපිට හිටපු හොඳම කිලර්, ඉස්සර කවදාවත් ඉලක්කෙ වරදින්නෙ නෑ"

" විශේෂයෙන් කියන්න ඕන කියල හිතුවෙ නෑ . මොකද සාමාන්‍යයෙන් ඔය වගේ දේවල් ටික දවසකින් හරියනවනෙ"

ක්‍රිෂාන්ත වෙනුවට කථාකළ අනෙක් අය කියූ දෑ ඇසීමෙන් පසු හා ඔහුගේ නිහඬබවත් දකින දකින කඩදාසිය මහත් ගිජු බවින් එකතු කිරීමත් හමුදා විනය රැකීමේ ක්‍රමවේදයන්ටත් බිඳිය නොහැක්කක්වූ තැන නිලධාරීන් විසින් ක්‍රිෂාන්තව මනෝ උපදේශනය සඳහා වෛද්‍ය රොෂාන්ත සමරනායක වෙත යොමු කෙරිණි .

.......................................................................

බොහෝ ප්‍රතිකාර ක්‍රම භාවිතා කළද රොෂාන්තට ක්‍රිෂාන්තව කථා කරවීමට නොහැකි විය. ඒ වෙනුවට ක්‍රිෂාන්ත අනෙක් වාට්ටුවල ලෙඩුන්ගේ ඇඳ ඉහපත් පවා පැහැරගෙන එකතු කරන්නට පටන් ගත්තේ ය. එකතු කරන සියල්ල යළි යළි කියවමින්.

බලාපොරොත්තු සහගත වෙමින්.
බලාපොරොත්තු කඩකර ගනිමින්.
කෝප වෙමින්. දුක් වෙමින්.
දිනෙන් දින කුඩාවන වපසරියක හැසිරෙමින්.

..........................................................................

රොෂාන්ත. සිය දෛනික සේවා වටයක් යද්දී ක්‍රිෂාන්ත ජනේලයෙන් එළියේ තිබූ කඩදාසියක් දෙස බලාගෙන සිටියේය. මහත් ගිජුකමින්.

පිටුපසින් ඇවිද ගිය රොෂාන්ත ක්‍රිෂාන්තගේ උරමත අත තැබුයේ ය.

**ක්‍රිෂාන්ත සලිතව ගියේය.**
තදින්. නොදැනෙන්නට තරම් සෙමෙන්.

ඔහු එක්වරම තම උරමතවූ රොෂාන්තගේ අත බදා ගත්තේය.
දැතින්ම. වැරෙන්. ආපසු නොහැරී.

අනතුරුව කෑ ගැසුවේ ය.

" කුෂා, ඔහොමම අල්ලන් ඉඳපන්. මං උඹව කොහොම හරි ගෙනියනවා. අපි දෝණිගෙ පාටි එකට ගෙදර යනවා මචං !"

ටික වේලාවක්. කිසිත් සිදු නොවිණි.

ක්‍රිෂාන්ත ආපසු හැරුණේ ය.
රොෂාන්ත දෙස බැලී ය.

" එච්චර කියලත් ඇහුවෙ නෑ. උරහිසේ ඉඳන් පිට දිගේම අත් දෙක ඇදගෙන ගිහින් බිමට වැටුණා" යැයි පවසා තවත් සත් මසකට නිහඬ වූයේය.

.............................................................................

රොෂාන්තට ඉන්පසු ක්‍රිෂාන්තව කථා කරවීම කල නොහැකි වුවද ඔහුගේ කලහකාරී හැසිරීම් අඩුකිරීමට හැකි විය.
එසේත් නැතිනම් ඔහු කඩදාසි පැහැර ගැනීම වෙනුවට තමා අතට දෙන කඩදාසි පමණක් එකතුකරන තත්වයට පත් කරගැනීමට හැකි විය.

එහි ප්‍රතිඵලයක් ලෙස දිනකට කඩදාසි කිහිපයක් ඔහුට ලබා දීමේ නිර්දේශය මත ක්‍රිෂාන්තව සිය බාරයෙන් නිදහස්කොට යැවීමට වෛද්‍ය රොෂාන්ත තීරණය කළේ ය.

ඒ තීරණය අනුව ක්‍රිෂාන්තට මාස තුනක නිවාඩු ලබාදී ඔහුගේ නිවසට යැවීමට නිලධාරීන් තීරණය කළෝ ය.

කඩදාසි නිර්දේශය එලෙසම ක්‍රියාත්මක කරන ලෙස වූ උපදෙස් ද සමඟ.

" පිස්සුලු නේද?"

" පව් අප්පා යසට හිටපු කොල්ලා"

" හෙනට මරල තියෙනවලු. ඒ පාපෙ පටිසන් දීල"

" දැන් ඉතිං යසෝගෙ කෙල්ලට තමයි .......!" " හොඳ වැඩේ ඔය තේ උඩිච්චිට"

" මැරිලවත් හිටිය නම් පාරට නම එහෙම දාල පෝස්ටරයක් ගහල සමරන්න තිබ්බා පව් මචං...! "

ඒ සියළු කථා පැතිරයද්දී ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියුම්කරුවෝ ලියුම් බෙදූ හ.

එලෙස බෙදූ එක් ලිපියක් ක්‍රිෂාන්ත බාර ගත්තේ ය. නිහඬව. දෑතින් ම.

ලිපිය කැඩුවේ ය. කියෙව්වේ ය.
තුන් වරක් සම්පූර්ණයෙන් ම. මුල සිට අගට.
යළි හතර වරක් කියෙව්වේ ය. එලෙසම.

සම්මත සාමාන්‍ය මිනිසෙකු බවට පත්වෙමින් ක්‍රිෂාන්ත මුලින්ම කීවේ වචන හතකි.

" අම්මේ.......! ඒක හම්බ වුණා....! මාව අස් කරලා ....!"

# සබන් කොළ.

රාත්‍රිය. පැය දෙක හමාරකට පෙර ගෙවීගොස් තිබිණි.

දෙපා. තටු සහසක් ආවද පැන යා නොහෙන සේ කොට්ටයක් තෙරපාගෙන සිටියෝ ය.
උඩින් හා යටින්.

ඇය වළාකුලකින් බැසවිත් ඇහැරුණා ය. කොහු හා රබර් මිශ්‍රිත මෙට්ටයක් මත.

කම්මැලිව පෙරලුණා ය. බිත්ති ඔරලෝසුවෙහි වේලාව දැක්කාය.

ඇඳෙන් පැන්නා ය. මඳක් තෙත වූ තුවාය ගත්තා ය. විවර ලැම වටා ඔතා ගත්තා ය.
කලිසම කකුල් වලින් පන්නා දැමුවා ය.
කොමුපිළි ද සමඟ ම. එකකින් පාගා අනෙක ද අනෙකින් පාගා එකක් ද ලෙස.

සබන්. කුඩා නාන කාමරයෙහි තිබුණේ නැත. එළියෙහි. කාමරය තුළ. කුඩා සබන් කැටයක් තිබිණි. දවටනය ගලවා යලි එතූ.

දවටනය මත. නිල් ඉලක්කම් දහයක් සටහන් ව තිබිණි.

ඇය නාන කාමරයෙන් එළියට ආවා ය.
නොනා ම.
සබන් කැටය ගත්තා ය. කොළය ලිහාගත්තා ය. සීරුවෙන්.

ප්‍රශ්න. ඔහු විසින් නාසන ලද්දේ ය. ඒ ඇසුවේද ඇයම ය.
පිළිතුරු. ඔහු මුවින් නොදුන්නේ ය. ඒ වෙනුවට ඇගේ නෙතු එල්ලේ බලා සිටියේ ය.
සුදු නරියෙකු ව. ඇස් තදින් විවර කර.

ඇය. මඳක් විපිලිසරව සිටියා ය. නරි දෙනක වන්නට පටන් ගත්තා ය. මුලින් අළු පැහැව. පසුව සුදු වෙමින්. සෙමෙන්. නිතැතින්.

කිරි සයුර. ඔවුන් විසින් කැළඹෙමින් තිබිණි. ඒක තානයකින්. විටෙක තදින්. යලි සෙමෙන්.

ඒ අතර. ඔවුහු නොකඩවා රූපාන්තරය වූවෝ ය. අමෘතය සොයමින්. සාවුන්. මුවන්. ගෝනුන්. ගැරඬින්. කොකුන්. පැස්බරුන් වෙමින්.

වෙළඹ. සුරත පා යමක් සෙව්වා ය. දෙපා අතරින්. අශ්ව දෙනෙතක්. ඇයි දැයි ඇසී ය. ඇගේ වුවනට ඉහළින් එබෙමින්.

ඇය. හිස දෙපසට වැනුවා ය. දෙනෙත් පියමින්. රබර්. තම මෙහෙය කරමින් සිටියේ ය . අනතුරකට පත් නොවී. වෛරස් ද බැක්ටීරියා ද දිලීර මෙන්ම ප්‍රෝටීන ද වලකමින්.

මකුළු දෙන. මකුළුවා තමා වෙතට ඇද ගත්තා ය. තද කරගත්තා ය. නොකෑවේ ය. සිරුර තුළ දියව යෑමට ඉඩ හැරියා ය.

සුදු නරියා. මිනිසෙකු වෙමින් සිටියේ ය. එහෙම ම වැතුරුණේ ය. ඇගේ වම් පසින්. සුරත වමතේ පටලාගෙන. ලා නිල්පාට විදුලි සඳට යටින්.

නැඟිට්ටේ ය. ඇවිද ගියේ ය. මුලින් කුණු කූඩය වෙත. අනතුරුව ජල කරාමය වෙත.

යලි ආවේ ය. ඇය දෝතින් උස්සා ගත්තේ ය. යලි කරාමය වෙත.

තුවාය. තෙත්ව ගියේ ය. රඳවනය මතට විසිකෙරුණේ ය.

රාත්‍රිය. තවමත් ඉතිරිව තිබිණි.

ඔහු කුඩා සබන් කැටය ගත්තේ ය. වටා තිබූ තුනී කොලය ගැලවීය. මේසය ළඟට ගියේ ය. කොළයෙහි යමක් ලිවීය. මුල් වරට කථා කළේ ය.

" ඔයාට ඕනෙ නම් තියාගන්න පුළුවන්. නැත්නම් වතුරට දාන්නත් පුළුවන් . ලේසියෙන් දියවෙනවා."

සබන් කොළය. යළි සබන් කැල්ලෙහි එතිණි. ඔහුගේ සුරත ඇගේ වමතතෙහි එතිණි.

" යන්නෙ නැද්ද?"
" ඔයාට නින්ද ගියා ම"

ඇය මඳක් පසුබා ගියා ය. කැමැත්තෙන්. බියෙන්.

" නින්ද ගියාම මොකුත් නැතුව මොකුත් කරන්න එහෙම එපා"

ඔහු නැඟිට්ටේ ය. ඇඳුම් රඳවනය වෙත ගියේ ය. ආපසු ආවේ ය.

පවුරක් ඇන්දී ය. මියුළු නුවර වටකොට.

ඈ සිනාසුණා ය. ඇදෙහි වැතිරුණා ය. නිදාගත්තා ය.

දැන්.
ඒ සබන් කොළය ඇ අත තිබේ. ඒ සිනාව සමඟම.

ඇය.
නැඟිට්ටා ය. සබන් කොළය අතැති ව.
මඳ විරාමයක් ගත්තා ය.
නාන කාමරය වෙත ගියා ය. කරාමය ඇරියා ය.

සබන් කොළය.
වතුරෙහි දියවී ගියේ ය.

# කුළු සහ පොලු.

එදාද විරෝධතාවයක් තිබිණි. උද්ඝෝෂකයෝද මඩින්නෝද සූදානම්ව සිටියෝ ය. එකිනෙකා කෙරෙහි හොරෙන් බලමින් . අහඹු ලෙස නෙතු පැටළුන විටෙක මළානික සිනා පාමින්. වරෙක සැකයෙන්. අනුකම්පාවෙන්. නොසැලකිල්ලෙන්. තරහෙන් පිලිකුලෙන්.

විරෝධයට ලක්වන්නෝද අණ දෙන්නෝද දුරින් සිට බලා සිටිය හ. පොළොවට මීටර් ගණනක් උසින්. වීදුරු තුලින්. ජනෙල්වලින් හෝ වීඩියෝ තිරයන්ගෙන්.

යකඩ. ගල්. වතුර. රබර් හා ලී.
විවිධාකාර හැඩයෙන් යුතුව තැන තැන තිබිණි.
නිශ්චල ව. නිශ්චිත කාරියක් ඇතිව.
වීදුරු. වයර් හා ප්ලාස්ටික් පසෙකින් ඇති ව.

අවශේෂ ජනයා ද සුළඟ ද අවුරැස් ද ඔහේ පාවෙමින් පැවතුණෝ ය. සංසාර චක්‍රය පුරමින්.

පිරිස.
මුලින්ම පෙළ ට හිටගත්තෝ ය. අනතුරුව. බෝඩ් ඉස්සීම. කෑ ගැසීම. විරෝධතා ගී ගැයීම විය. සාම්ප්‍රදායානුකූලව.
ඉන්පසු පා ගමන.

නියමුවෝ ද නියමුවන් ගේ ඉදිරි අනුප්‍රාප්තිකයෝ ද ඉදිරියෙන්ම ගියෝ ය.
කැපවීමෙන් අභිමානයෙන් හා බලාපොරොත්තු - වෙන්.

පසුපසින් ම යන්නෝ ද සිටියෝ ය. බෑ කියන්නට බැරි කමට කොන් වීමට බියෙන් චේන්ජ් එකකට හෝ තම සිත් ගත් අයවලුන් යන හෙයින් වැනි නේක කාරනාවන් තිබූ.

මැද්දෙන්. සාමා ද අමර ද ඇන් ද ටාරෝ ද මුරු ද ඇවිද ගියෝ ය. සරෝජා සමඟින්.

බැරියරය. යකඩ වැටවල් තුනකින් යුතු විණි. එක පෙලට සිට වූ. පාර දෙකට බෙදමින්. පෝස්ටර් ද බැනර් ද බෝඩ් ද එක් පසෙකටත් කුළු ද පොලු ද කඳුළු ගෑස් ද උණ්ඩ ද තව පසෙකටත් වෙන් කරමින්.

ඉදිරියෙන් ම ගිය අය. බැරියරයේ හැපී නොහැපී මෙන් නතර වූහ. ආපසු හැරුණ හ. කෙලින් සිට ගත් හ. පෙළෙහි මැද්දෙන්ම සිටි කෙනා අතට මෙගාෆෝනයක් පත්කළෝ ය.

මෙගාෆෝනය. සුපුරුදු සංඛ්‍යාතයන්ගෙන් කම්පනය වීම ඇරඹී ය. පුරුදු අනුපිළිවෙලින් ම.

බොහෝ විස්තර කිරීම් වලින් පසු ඒ රණකාමී වදන්පෙළ පිට කෙරිණි.
බැරියරයෙන් එහා පැත්ත ද මෙහා පැත්ත ද පාරේ දෙපැත්ත ද වීදුරු වල ඉදිරිය ද අමන්දානන්දයට පත් කරමින්.

" මේ විදිහට බාධක පිට බාධක දැම්මත් එකා පිට එකා වැටුනත් අපේ ගමන අපි යනවා ...!!! අපි ව නවත්තන්න කාටවත් බැහැ!! "

තත්පර හතලිස් තුනක නිහැඬියාව.

මුලින්ම අත තැබුයේ මෙගාෆෝනයට දෙදෙනෙක් දකුණින් සිටි කෙනා ය.
ඒ මැදින් තිබූ යකඩ වැටට ය.

ඒ මොහොතේම. අනෙක් අය ක්‍රියාත්මකවන්නට කලින්. ටාරෝ ඉදිරියට ආවේ ය. අතින් ඇද්දේ ය. මෙගාෆෝනයෙන් වර්ධනය කල හඬ හිමියාගේ.

" අයියෙ! ඇයි මේක කඩාගෙන යන්නෙ? "

ඔහුට පිළිතුරු ලැබුණි.
විශ්මයෙන්.
නොරිස්සුමෙන් නමුත් ආඩම්බරයෙන්.
" මේ ඉල්ලීම් ටික මහ එවුන්ට බාර දෙන්න"

ඊලඟ ප්‍රශ්නය තිබුණේ සාමාට ය. නමුත් ඊට පෙර ක්‍රියාව හා ප්‍රතික්‍රියාව ඇරඹී තිබිණි. යකඩ බැරියර් තුනම එහාට මෙහාට ඇදෙමින්. බල තුලනය වන ලක්ෂ්‍යයන් විසින් තැනෙන රේඛා වෙනස් කරමින්.

මුරු. මෙගාෆෝනය සියතට ගත්තේ ය. 'කීං' ගාන ප්‍රමාණයට වඩා මඳක් අඩුවෙන් ශබ්ද පරිමාව සැකසී ය. මයික්‍රපෝනය සාමා දෙසට ලං කළේ ය.

ගැහැණු විලාපයකට බොහෝ දෑ කල හැක්කේ ය.

එහෙයින්ම සියල්ලෝ තම කටයුතු නවතා මෙගාෆෝනයෙන් ඇසුණු හඬ දෙසට හැරුණෝ ය.

බැරියර්. මඳ අස්වැසිල්ලක් ලද්දේ ය.

ඒ ලද නිමේෂයේ සාමා තමන්ගේ ප්‍රශ්නය ඇසුවා ය.
" ඔය ලියුම අදම දෙන්න ඕනෙ ද ? මෙච්චර කරදර විඳගෙන ! "

ඇතැමෙක් සිනාසුණෝ ය. ඇතැමෙක් විශ්මයට පත් වූහ. බොහෝ දෙනා කෝප වූහ. සාමා වටකර ගත් හ. සරෝජා ද අමර ද ඇන් ද ටාරෝ ද මුරු ද සමඟින්.

ඇතැමෙක් පහර දෙන්නට තැනූ හ. නියමුවන් ඔවුහු වැලකූ හ.

" පිස්සු ද ? "

නියමුවකු ඇසූ පළමු ප්‍රශ්නය විණි. අනතුරුව පැහැදිලි කිරීම. මෙගාෆෝනයට නෑසෙන සේ.

" හෙට මේක දෙන්න ගියාම උන් බාර ගනියි. ඒත් උන්ට දැනෙයි ද ? මීඩියාවලින් අපිට කවරේජ් එකක් දෙයි ද ? වෙන එකක් තියා පැළුණු ඔළුවක්වත් නැතිව මිනිස්සු අපි කියන දේ අහයි ද ? "

සාමා ද අමර ද ඇන් ද ටාරෝ ද මුරු ද සරෝජා ද හැරුණෝ ය. තත්පර විසිතුනක නිහැඬියාවකට පසු. බැරියර දෙසට.
ඉඩ පාදා ගනිමින් ඉදිරියට ගියෝ ය.

බැරියරයෙහි එහා පස. වික්ෂිප්ත දෑස් රැසක් බලා සිටියෝ ය.

සාමා ද අමර ද ඇන් ද ටාරෝ ද මුරු ද ඇවිද ගියෝ ය. සරෝජා සමඟ.
කැතට ඇදවී තිබූ බැරියරය සැකසූ හ.
පෙර පරිදිම.

පොළොවට උඩින් වෙසෙන අය. නොසන්සුන් වෙමින් සිටියෝ ය. ප්‍රශ්න ඇසූ හ.

" සර් ! උන් බැරියර් එක ආපහු හැදුවා !!" යන්න පිලිවදන් ලැබූ හ.

සාමා ද අමර ද ඇන් ද ටාරෝ ද මුරු ද සරෝජා ද ආපසු සිය පිරිස දෙසට හැරුණෝ ය. තැනින් තැන විසිරී ගියෝ ය.

උද්ඝෝෂකයන් මැද. ලඟ සිටියවුන් වැලඳ ගත් හ. උන් හා අත්වැල් බැඳගත් හ. උන්ගේ අත්වැල් බැන්දුවෝ ය.

උද්ඝෝෂකයෝ. සෙමෙන් සෙමෙන් උන් හා එක් වූහ. මුලින් සැකයෙන්. පසුව සෙනෙහෙන්.

අනතුරුව. ජනප්‍රිය ප්‍රේම ගීයක් ගැයීම ඇරඹූ හ. මුලින්ම තැනින් තැන. තතනමින්. පසුබාමින්. පසුව ඒකතානයෙන්. ජවයෙන්.

වීදුරු ද වයර් ද ප්ලාස්ටික් ද ඔවුන් දෙසට හැරුණෝ ය. සිය විකාශනාගාරයන් කාර්ය බහුල කරවමින්.

පාරේ පාවෙමින් සිටි ප්‍රෝටීන් හා කැල්සියම් රූපයන් ද මොහොතක ට හෝ නතර වූහ . සිතිවිලි ලබමින්.

පෝස්ටර් ද බැනර් ද සිය ස්ථාන වෙනස් කරගනිමින් සිටියෝ ය . උද්ඝෝෂකයන් හා බාහිර පරිසරය අතරට පැමිණෙමින්.

පොළොවට උඩින් වෙසෙන අය . නොසන්සුන් වෙමින් සිටියෝ ය. ප්‍රශ්න ඇසුවෝ ය. නියෝග නිකුත් කළෝ ය.

" සර්! ගහන්න පටන්ගන්නවත්, මුන් වැරැද්දක් කරන්නෙ නැනෙ!" යැයි පිළිතුරු ලද්දෝ ය.

# නිය පිට ගඟ.

මඟුල් උයන.
කුරුල්ලෙකුටවත් අවසර නැතිව ඇතුල්වීම තහනම් වූ හෙයින් කිසිදු ප්‍රේමාලිංගනයකින් තොරව ම නිද්‍රාවට පත්වෙමින් සිටියේ ය.

මංගල හස්තිරාජයා.
දුරබැහැර ගමනකින් ලද විඩාවෙන් ද රජුගේ ලෝහමය පා ආවරණ වලින් ලද පීඩාවෙන් ද පෙලනු ලැබ තම හොඬය වඩවඩාත් අකුලා ගනිමින් යලි දිග හරිමින් සහනයක් සෙවී ය.

රාජකීය යහන් ගැබ. මංගල හස්තිරාජයා සිටි තැනට මදක් දකුණින් ද මහල් දෙකක් ඉහලින් ද පිහිටා තිබිණි.

මුරකරුවෝ සය දෙනෙක්. රාජකීය යහන් ගැබට කිසිවකු ඇතුල්වනු හා පිටවනු වලකමින් සෙල්මුවා සෙයියාවෙන් නොසෙල්වී සිටියෝ ය.

ඉරබටු තරුව. පැල දිග අහසේ මතුව විත් හෝරා දෙකක් ගතවී තිබිණි.
මුරකරුවෝ සයදෙනා. එකවනම සලිත වී එකම දිශාවකට ශීර්ෂ නමස්කාරය කළෝ ය.

රජතුමා. පමණට මදක් වැඩිපුර පානය කල වාජීකරණයෙන් වඩ වඩා නෙරා ආ උදරය ද පෙරටු කොටගෙන රාජකීය යහන් ගැබට ඇතුල්වූයේ ය.

.........................................................................

පහන් තරුව. පෙරඹර නැඟ එමින් තිබුණි.
දුක්ගන්නාරාළ. රජුගෙන් ලද හදිසි කැඳවුමින් වික්ෂිප්ත ව රජතුමාගේ විවේක කුටියේ අසුන් ගෙන සිටියේ ය.

විවේක කුටියේ දොරටුව. මඳක් මෝඩකමින් ද වඩා උඩගු කමින් ද යුතුව විවර විණි.

රජතුමා. අපිලිවෙල වූ ඇඳුමින් ද ගතපුරා නැඟි දහ දියෙන් ද යුතුව දොරටුවෙන් ඇතුල්වූවේ ය.

“ඔබ කියූ ආකාරයේ අපහසුවක් වුණේ නෑ දුක්ගන්නාරාළ. ඈ කිසිදු විරෝධයක් නැතිව මෙතෙක් වේලා මා හා ගත කළා.

වෙනසකට කියා සිදුවුණේ මාගේ තේජස ට බියෙන් දෝ උමතුවෙන් මෙන් නැඟිට ගොස් සියළු පහන් නිවා දැමීම පමණයි.

ආ තව දෙයක්. ඈ එක ඉල්ලීමක් කළා. තම පිටෙහි හරි මැදින් තදින් අල්ලාගන්නා ලෙස. මා හිතන්නේ බිය නිසා විය යුතුයි. ඈය මට අත ඉවත් කිරීමට දුන්නේම නැහැ.”

දිනකර.
සඳෙහිද තරුවලද ප්‍රභාව නැති කරමින් පායා ආවේ ය.

හිරුරැස්.
ගං ඉවුරෙහි වූ තරුණයාගේ මළ සිරුර නහවමින් ගලා හැළුණේ ය.
තරුණයාගේ සුරත.
අපිලිවෙලට වැඩීගිය නියපොතු වලින් යුත් ඇඟිලි පහකින් යුක්ත වී ය.

නිය පොතු.
පෙරදින සැඳෑයාමයේ තමා වැලඳගෙන සිටි පෙම්බරියගේ පිටෙන් ගැලවී ආ අපිචර්මයෙන් ගැවසී වුවද අප්‍රාණිකවම වූයේ ය.

ගඟ. සයුර බලා ගලා යමින් තිබිණි.

# කිරුල මිණි.

- විදීම් සටහන් -

අප සියළු මිනිසුන් කරන්නා වූ බොහෝ ක්‍රියාකාරකම් හි අවසාන අරමුණ වන්නේ අනෙකා ඉදිරියේ තමා ස්ථානගතකිරීම බව මා විශ්වාස කරමි.
එහිලා ඉදිරිපත්කල හැකි හොඳම උදාහරණය මා වන හෙයින්.

සෘජු වාණිජමය අරමුණක් නොමැතිව කෙරෙන්නා වූ සමාජ සංස්කෘතික ක්‍රියාකාරකමකදී මේ තත්වය වඩාත් උත්සන්න වන අතර එම ක්‍රියාවෙහි පරමානන්දය වන්නේ අනෙකා විසින් තමා කියවූයේ කෙසේ ද යන්න දැනගැනීම ම වන්නේ ය.

පහත සටහන් වන්නේ මේ පොත කියවා අකුරු ලෙස සමාජගත කෙරුණු අදහස් ය. පුද්ගල තරාතිරම අනුව ඒ ඒ ලියවීම් මඟින් කියවන පිරිස් අතර මේ පොත ගැන කතාබහක් ඇති කිරීමට සමත් වූ බව ස්තූති පූර්වකව සටහන් කළ යුතුම ය.

මීට අමතරව හමුවී හෝ දුරකථනයෙන් හෝ කථා කළ තවත් අය ඇත්තෝ ය. ඔවුන්ට ද තුති පිදිය යුතු ය.

පුද්ගල චරිත ලෙස මේ ලියා ඇති ඒ ඒ කෙනා ගැන මාගේ හැඟීම් ගෞරවය හා සහෝදරත්වය අතර විවිධ අනුපාතයන්හි සම්මිශ්‍රණයක්ව පවත්නා අතර එහි ප්‍රමා-ණාත්මක බලපෑම අවම වන පරිදි ඒ ඒ ප්‍රකාශය සමාජගත කෙරුණු දින වල අනුපිළිවෙලින් පෙළ ගැස්වූයෙමි .

එමෙන්ම මේ කිසිදු සටහනක් ඒ ලියූ අයවලුන් දැනුවත් කිරීමෙන් පසු මෙහි යෙදුනක් නොවන බවද ඒ සටහන් මට කෙතරම් වටනේ ද යන්න හැඟවීම උදෙසා මෙන්ම නිර්මාණය සමඟ ගැටගසා තබා ගැනීමේ ලෝභයෙන්ද කළ උපුටාගැනීම් බවද නොදන්වා මෙහි බහාලීම සම්බන්ධයෙන් උරණ නොවනු ඇතැයි ද අවසාන වශයෙන් ලියා තබමි.

අනුරසිරි හෙට්ටිගේ

විසල් සේනාතිලක

සදිනි ප්‍රාර්ථනා තෙන්නකෝන්

වරුණ සුදන්ත හේරත්

උපේක්ෂා ප්‍රේමතිලක

මහේෂ් රත්නායක

රවීෂ තිලකවර්ධන

කල්පනා ඇම්බරෝස්

රසිකා ගුණවර්ධන

සිතුවිලි සිතු

බෝධිනී සමරතුංග

ලහිරු කිතලගම

උදාරි රාජපක්ෂ

ලියනගේ අමරකීර්ති

කමල් පී අලහකෝන්

අනුරසිරි හෙට්ටිගේ

2017.09.08.

https://www.facebook.com/anurasiri.hettige/posts/1399172723531346

## විචාරයක් නොවේ

දිනය 2017.09.07. වැසි සහිත දිනයක්. ඒ වුණත් කාංචනා අමිලානි කරුනාමුනිගේ 'බූමරංගය" නැරඹීමට යාම බලවත් අපේක්ෂාවක් විදිහට තිබුණා. හොඳ වෙලාවට සහන් කසීර වික්‍රමසංහ කියන තරුණ කපු මහත්තයා කතරගම දෙවියන් එක්ක කරන මහා ගනුදෙනුවට පින් සිද්ධ වෙන්න හවස් අතේ වැස්ස නවත්ත ගත්තු නිසා මමත් එහි ගියා.

ඒ තැන සුපිරි ය. කතාබහ පෙනුමෙන් බරසාර ය. නමුත් ඇතුලු වුණ හැටියෙම දැක්කෙ අනිල් හේරත් සහ බන්දුජීවලා සිගරට් බොන තැනයි .. මේ දවස්වල සිගරට් ඇලජක් උණත් මේ කොල්ලො ටික ඇලජික් නැති නිසා මං නැවතුණේ. එතන.. හුඟ දවසකට පස්සෙ කල්පනා ඇම්බ්‍රෝස් එතනදි හමු වුණා .. බාජ්‍ය බෝජ්‍ය සුපිරියකින් පස්සෙ මං යන්න හදද්දි මගේ අතකින් අල්ල ගත්තු අනිල් හේරත් තරුණ මහත්තයා පාරට ගිහින් කාරයක ඩිකිය විවර කරලා පොත් පිංචක් මගේ අතේ තිබ්බා.

‘අය්යෙ.. මේ මගේ පොත .. අර මං කිව්වෙ කෙටිකතා පොත..“

‘ඇත්තද.. හරිම සතුටුයි මල්ලි ..“

සුබ පැතුම් හුවමාරු උනා මං ගියා .. බස් එකට නැග්ගා. සීට් එකකුත් තිබුණ නිසා පොතත් පෙරළ ගත්තා..

පොතේ නම - සැණෙලි වියුම්- පිට කවරයේ සටහන් කරලා තිබුණා මේ කෙටිකතා සංග්‍රහයක් කියලා. නමුත් නිර්මාණ කියව ගෙන කියව ගෙන යද්දි මට දැනුණෙ කෙටිකතා රීතියට නැකම් කියන ඉතාමත් අපූරු ආඛ්‍යානයක් වියමනක් මගේ ඇස් ඉස්සරහ දිග හැරෙන බවක් . අනිල්හේරත්ගේ මේ නිර්මාණ , කෙටිකතා ශානරයේ තමන්ට හිමි තැන අනාගතයේ හමිකරගනු ඇතැයි යන විශ්වාසයක් මට තිබුණා..

ඒ නිර්මාණ හතරක් පමණක් කියවා දිනයට නතර කළ තැන දක්වා. මට හිතුණෙ එදා ජී.බී. සේනානායක විසින් ඉදිරිපත් කරන ලද 'නිදහස් රීතියේ කවි' පසුව නිසදැස් කිවිය ලෙසින් ස්ථාවර වූ සේ මෙම නිර්මාණ ද අනාගතයේ ශානරීය අයිඩෙන්ටියක් අත්පත් කර ගනු ඇති බවක්.

මුහුණු පොත ඔස්සේ බිහිවන මේ නව ශානරීය ලක්ෂණ සහිත සාහිත්‍යය අද නොසලකා තිබෙන්නට ඉඩ හැර ඇතත් අනිවාර්යෙන්ම එය හෙට දවසේ සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රෙය් බරපතළ කතිකාවක් බවට පත්වෙනවා නියතයි කියලා මට දැනෙනවා.

මේ නිර්මාණ සංග්‍රහයේ ඉතිරි අඩ කියවලා ඉවර කළේ මේ දැන්.. බලන්න අනිල් ඊයේ මා තැබූ ස්ථානයේ සහ දැන් ඔබේ කෘතිය මා තබා ඇති ස්ථානයේ වෙනස .. මං දැන් කලබලයකින් සැණෙලි වියුම් ගැන මොනවදෝ කොටනවා..

හපොයි අනිල් මල්ලි . ඔයාගේ කෙටිකතා ටික මට හමු වුණේ දෙවනි භාගයෙදි නේ .. රතු සහ කළු (එල), තුන්වෙනි සීනුව (විශිෂ්ටයි) , කඩදාසි (මාරයි) සහ කුලු සහ පොලු (උත්ප්‍රාසාත්මකයි) කෙටිකතාවේ විශිෂ්ටත්වය ස්පර්ශ කරන නිර්මාණ මල්ලි.

ඊට පස්සෙ මං මුල නිර්මාණ ආයේ කියෙව්වා. හරිම අගෙයි.

කෘතියට හිමි තැන හෙට අදාළ තැන තියාවි. සමහර විට නොතියාවි.. එහෙත් අද මං ඒ නිර්මාණ ඇසුරෙහි අනාගත විශිෂ්ටත්වයට පත් විය හැකි ලේඛකයකු අඳුනා ගත් බව පමණක් කියනවා.. මං වඩාත් කැමති ඔයා ලේඛකයකු විදිහට 'දේවල්' (සිදුවීම්) තුළ තියෙන 'දේවල්' (හැඟීම්) ප්‍රකාශ කිරීම වෙනුවෙන් සකස් කරගෙන ඇති අකෘතියට. ඒ ආකෘතිය නැවුම් මෙන් ම බලවත් එකක්. ඒ ආකෘතියට අදාළ වැකි ඉතා සීමිත වුවත් ඒ තුළ සඟවා ඇති පුළුල් අර්ථ පාඨකයාට යහපත් කියවීමක් ලබා දීමට සමත්. පාඨකයාගේ වැඩ බිම ඇතුළෙ අර මං කියපු ඔබ හංගපු 'දේවල්' සහ දේවල් ' ක්‍රියාත්මත වෙද්දි ඔවුන් ආනන්දයක් ප්‍රඥාවත් එකවර අත්පත් කර ගන්නවා නිසැකයි.

අනික් කාරණය ඔබ විසින් කියවා ගනු ලැබ තියෙන සමාජය. ඒ සමාජය තුළ වෙසෙන මිනිසා බොහිමියානු අර්ධයක් සහිත වුවත් ඊට වඩා සප් රාණික ජීවියෙක්. ආදරය පිරී ඉතිරි ගිය මනුෂ් යෙයක්. මේ ගැහැනු පිරිමි සැබැවින්ම අපෙන් ඉල්ලා සිටින්නේ ප්‍රශ්න වලට විසඳුම් නොවේ . ජීවිතයම පමණක් ම බව මට දැනෙනවා මල්ලි.. අර බලන්න ඔයා ‘කඩදාසි‘ ඇසුරේ මතු කරන පශ්චාත් යුද සමයේ යුද සෙබල ජීවියාගේ සැබෑ හෘදය සාක්ෂිය. මං තිගැස්සුණා අනිල් මල්ලි.. මෙය විචාරයක් නොවන නිසාත් මා විචාරයකු නොවන නිසාත් මේ ඇති අනිල් .. මං මගේ පීඩනයෙන් නිදහස් විය හැකි තරමට පමණයි ලීවේ..

මෙය කියවන අය අනිල් හේරත්ගෙ සැණෙලි වියුම් කියවන්න..

ඒ මං කියන නිසා නොවෙයි. එය ඔබ කියැවිය යුතු ම නිසා.

අවසාන වශයෙන් මෙහි මුල් පිටුවක අමුණා ඇති, අප අතරින් සමුගත් සහෘද 'සමර විජේසිංහයන්' මුහුණු පොත් සටහනක් ඔබට ගෙන එමි.

samara wijesinghe

අපූරුයි අනිල්!

(මම කියවන්න පටන් ගත්තෙ අකමැති වෙන්න හිතාගෙන)

සමර විජේසිංහගේ එම සටහනේ හැම අකුරක්ම (වරහන් ද සහිත ව ) මගේ සිතුවිලිවලටත් සම්පූර්ණයෙන් ම එකඟ වුවත් මමත් ඔබට මෙසේ කියමි.
''අපූරුයි අනිල්..!1

විසල් සේනාතිලක

2017.09.08

https://www.facebook.com/groups/sinhalareaders/permalink/1471908089552020/

“සැණෙලි” යන වචනය මට සිහි කරනුයේ අහසේ එක වර දැල්වී එසැනින් නිවී යන අකුණුය. අනිල් හේරත්ගේ “සැණෙලි වියුම්” මා කියවන්නට පටන් ගන්නේ අකුණක් බලාපොරොත්තුවෙන් වග කියව යුතුය .මගේ බලාපොරොත්තු ඉටු කරමින් අනිල් “අකුණු” වියමනක් මා සන්තක කර ඇත . මේ සටහන අකුණක් මෙන් නිමේශයක් දැල්ව නිවී ගොස් ගිගුරුමක කම්පනයක් ඉතිරි කරන කෙටි කතා දහතුනක් (නපුරු ඉලක්කමක් හැබැයි ) කොළ අතර අකුරු වී ඇති “සැණෙලි වියුම්” නම් කෙටි කතා සංග්‍රහය පිලිබඳවය.

“සැණෙලි වියුම්” කංචුකයම මට නම් කෙටි කතාවකි.එහි සිටින කොට කලිසම්කාරයා බලා සිටින්නේ නිදා සිටි ඇඳක ඇඳ රෙද්ද මෙන් රැලි නගන මහ මුහුද දෙසද නැත්නම් උස සහ පහත තලවල අතු විහිදවා ගත් කොන්ක්‍රීට් වනාන්තරය දෙස දැයි මම තවමත් නොදනිමි .ඔහු දුකෙන්ද, සතුටෙන්ද,කෙටි කතා පොතක ඉදිරි පස පිටුවක සිටීම නිසා තරමක් ලජ්ජාවෙන් දැයි කියා මා නොදන්නේ ඔහුගේ මුහුණ මා හට නොපෙන්වන නිසාය.

ඔහු කිසිදාක ඔහුට සිතෙන දෑ පැවසීම නොකරනු ඇත, නමුත්, අපිට සුන්දර අනුමානයන් ඔස්සේ මනස අයාලේ යැවීමට ඔහු කදිම හේතුවක් බව මට සිතෙයි,ඔබටද එසේ සිතීමට සහ නොසිතා සිටීමට අයිතියක් ඇත්තේය .මම මේ කංචුකයට ඉතාමත් ආදරෙමි.

අනිල් ඔහු ලියා ඇත්තේ කෙටි කතා බව තැන් කිහිපයකම අවධාරණය කලද , මම වැනි මුරණ්ඩු කියවන්නන් ඔබ කියන කියන දෑ පිළිගනී යැයි සිතනවා නම්,ඔබ අදහස වෙනස් කරගත යුතු කාලයයි අනිල් . මට මේ 'කෙටි කතා' කෙටි කතා වලටත් වඩා දිගු කවි මෙන් දැනෙයි .මම කෙටි කතා නැවත නැවත කියවන්නේ කලාතුරකින් වුවත් කවි නම් නිතර එලෙස කියවා රස විදිමි. "සැණෙලි වියුම්" මම මේ වන විටත් කිහිප වරක්ම කියවා ඇත්තෙමි. මට "සැණෙලි වියුම්" පළමු වර කියවීමේදී දැනුන දෑ දෙවන වර දැනුනේ බොහෝ වෙනස් ලෙසය. තෙවන වර මට සිතීමට තවත් මාවතක් විවර වී පෙනෙයි . අනිල් යොදාගෙන ඇති භාෂාව සුමටය . මහා වැස්සකට පසුව හමා යන තෙත් සීතකින් භාෂාව පෙඟී ඇති වග මට සිතෙයි , දැනෙයි.මෙහි කතා ඕනිම කෙනෙකුට කියවා රස විදීමට බාධාවක් නැති වීම නම් ඇත්තටම සතුටකි .කෙටි කතා කියවා වෙහෙසව සිටි මට නැවත කියව කියවා

රසවත් වීමට “සැණෙලි වියුම්” උපකාර කරමින් සිටියි. මින් මා කැමතිම කතාව “අත් සහ මාංචු” ය. ඉන් කුඩා කොටහක් උපුටා දැක්වීමට මම අවසර ඉල්ලමි.

“මාංචු.                                                                .
එකම යකඩින් තනා තිබිණි. යතුරු පමණක් වෙනස්ව.”

අනිල්ගේ කෙටි කතා තුල අකුරු වලට වඩා හමුවන්නේ විරාම ලක්ෂණය . වැඩියමත් නැවතීමේ ලකුණුය .ඔහු කතා කරන්නේද, ඔහු කතා කරවන්නේද ,ඔහු කතාවක් කියවන්නේද , බොහෝ තැන වල නවතිමින් නිවීහැනහිල්ලේය. ඒ කුඩා නැවතීමේ තිත සමහර වචන අසලින් රැඳී “මෙතන නැවතිලා ටිකක් හිතලා ඊළඟ වචනයට පලයන්” යැයි කරන සුන්දර බලහත්කාරයක් බව සිතෙයි. අපි ඉතින් හිත අයාලේ ගොස් නැවත ආපසු පැමිණෙන තෙක් අනිල්ගේ බලකිරීම මත නැවතීමේ තිත අසල රැඳෙන්නෙමු . ඒ නැවතීම

කතාවට බරක් මෙන්ම කාව්‍යාත්මක රිද්මයක් ගෙනේ යැයි මට සිතෙයි.

"සැණෙලි වියුම්" මා කැමතිම පොත් ගොන්න අතරට අනිල්ගේ " ආදරය සහ ස්තුතිය" සමඟ මේ වන විටත් එක්වී හමාරය .පොත මා සන්තක වූ සුන්දර අහම්බය ද මතක ගබඩා වල ප්ලැටිනම් සේප්පුවක බොහෝ සුරක්ෂිතවය.මම "මේ පොත අරන් කියවන්න" යැයි පොත් නිර්දේශ කර ඇත්තේ ඉතාමත් ස්වල්පයක් වී ඇත්තේ මා බොහෝ " අමුතු" කියවන්නෙක් යැයි මම සිතාගෙන සිටින නිසාමය.නමුත්, අනිල්ගේ කුළුඳුල් කෙටි කතා එකතුව ඔබ අනිවාර්යයෙන් කියවිය යුතු පොතක් බවට මම කියා සිටීමට කැමැත්තෙමි. එවිට ඔබටද මා මෙන්ම අලුතින් මගේ ශබ්ද කෝෂයට එකතු වූ "සැණෙලි" යන වචනයට මට කැමති තේරුමක් දුන්නාක් මෙන් තවත් තේරුමක් ලබා දීමට හැකි වේ යැයි මා සිතන නිසාය.

සඳිනි ප්‍රාර්ථනා තෙන්නකෝන්

2017.09.10

https://www.facebook.com/sandini.tennakoon/posts/10203460579230731

"චන්ද්‍රසේන. බසය පිරෙන්නට සෙනඟ සිටිය ද, වේලා සටහන්කරු කිහිප විටක්ම නලාව පිම්බද, බසය ඉදිරියට නොගත්තේ ය. ඉදිරිය බලාගෙනම සිටියේ ය. පණගැන්වූ රියෙහි සුක්කානම මත දෑත තබාගෙනම..."

මම අනිල් හේරත්ගේ "සැණෙළි වියුම්" කියෙව්වේ බස් රියක යන ගමන්. හරිම අහම්බයකින් "සැණෙළි වියුම්"වල පළවෙනි කතාව "හෙමින් යන බස්".

කතාවේ බස් එක එලවන්නේ චන්ද්‍රසේන. චන්ද්‍රසේන එලවන බස් එක යන්නේ චන්ද්‍රසේනට ඕන වෙලාවට. චන්ද්‍රසේනට ඕන වේගෙන්.මගීන්ගේ රැවුම් - ගෙරවුම්, නො ඉවසිල්ල චන්ද්‍රසේනට ගාණක් නැහැ.

අපි හැමෝම ඉන්නේ බස් එකක . අපි කවුරුත් යන්නේ සුක්කානම මෙහෙයවන කෙනා යන්න කැමති වේගෙන්. ඒ කෙනාට ඕන වෙලාවට. බස් එක ඇතුලේ වෙන දේවල් සුක්කානම අල්ලන් ඉන්න කෙනාට අදාලම නැහැ.

"හෙමින් යන බස් " එලවන චන්ද්‍රසේනටත් එහෙමයි. ආ.. හැබැයි එයාට බස් එකේ යන්න ඉන්න එක මඟියෙක් අදාලයි ..තාම එයා බස් එකට නැඟල නෑ... ඒකයි මේ හෙමින් යන්නේ.

දාසය වෙනි නැවතුමෙන් නගිනවා සමන්තිකා. ඒ තමයි මේ බස් එකේ යන මගීන්ගෙන් , සුක්කානම අල්ලන් ඉන්න චන්ද්‍රසේනට අදාළ එකම එක මගියා.

නැවතුම් පහළොවක් යනකම් චන්ද්‍රසේනට ඕන වේගෙන් ගිය බස් එක, දාසය වෙනි නැවතුමේ ඉඳන් යන්නේ සමන්තිකාට ඕන වේගෙන් ! කොටින්ම කිව්වොත් රියැදුරු ආසනේ ළඟ ඉඳන්

බස් එක එලවන්නේ සමන්තිකා කියල කියන්න පුළුවන් තරමටම බස් එකේ වේගය මාරුවෙනවා.

බස් එකේ අරමුණ මගීන්ව ගමනාන්තයට ගෙනියන එක වුණත්, සුක්කානම අල්ලන් ඉන්න කෙනාට අවශ්‍ය ඔහුට අදාළ මගියාව ගමනාන්තෙට ගෙනියන එක විතරයි. ඉතුරු මගීන් ඔක්කොම , ඔහු අදාළ පුද්ගලයාව ගමනාන්තෙට ගෙනියන ක්‍රියාදාමයෙන් වාසි සැලසෙන, එහෙම නැත්නම් ඔහු අරමුණකින් තොරව සේවය සලසන පුද්ගලයන් බවට පත්වෙන්නේ ඉබේටමයි.

චන්ද්‍රසේන එලවන බස් එක යන්නේ චන්ද්‍ර - සේනට ඕන වෙලාවට. චන්ද්‍රසේනට ඕන වේගෙන් කියල අපි මුලින් හිතුවට චන්ද්‍රසේන එලවන බස් එක යන්නේ සමන්තිකාට ඕන වෙලාවට, සමන්තිකාට ඕන වේගෙන් කියල අන්තිම වෙද්දී අපිට තේරෙන්න පටන් ගන්නවා.

මේ බස් එකේදී, බස් එකේ වේගය තීරණය කරන සමන්තිකාම, තව බස් එකකදී පොදු මගී කුලකයේ එක අංකයක් විතරමයි!

වරුණ සුදන්ත හේරත්

2017.09.10

https://www.facebook.com/groups/sinhalareaders/permalink/1472819509460878/

ස්වර්ණ පුස්තක සම්මාන උලෙළෙන් පසු බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා රථගාල් පරිශ්‍රයේදි පැවැත්වූ මහෝත්සවයේදි සැණෙලි වියුම් කෘතිය කතුවරයාගේ දෑතින්ම ලැබීමේ භාග්‍යය උදාවුනා..

කොටුවේ ඉදන් ගමනාන්තයට ගතවෙච්චි පැයේදි "සැණෙලි වියුම් " සියයට අනූවක්ද, නිවසට ගොඩවූ සැනින් ඉතිරියද කියවා හමාර කරා. පොත කියවපු ගමන් මැදිවූනු උභතෝකෝටිකය වුනේ.. හුටාහ් සැණෙලි වියුම් කියන්නේ අහවල් එකක්ද? සුපුරුදු ලෙස පිහිටට ආවේ හෙළවෙන් වනන්නන් අතර වත්මනේ ඉදිරියෙන් සිටින අපේ කාලයේ කතු තුමෙක්.

හොදම සිද්ධිය ඒකාද තේරුම දැන ගෙන ඇත්තේ Anil Herathගේම පෝස්ටුවක් කියවූ පසුය.

සැණෙලි වියුම් යන්නෙහි සරල අර්ථය ක්ෂණික- කෙටි ලිවීම්ය.

නමුත් පිටු හැටක් අතරේ රදවන කෙටිකතාත් නොවන කවිත් නොවන ඔහුටම ආවේනික ගෙතුම් දහතුනම කෙටි ලිවීම්-කෙටි වචන-කෙටි වැකි වුවත් මහා කතාය . දහතුනෙන් කෙටිම ගෙතුම වන "මුදු සහ කෙස්" කියවන්න. මහා කතාවක් අවම වචනවලින් ලිවීමේ කලාව ගැන ඉරිසියා හිතෙන තරමටම එය ලොකුය.

"පොත් කියවන අය" වෙතට කියෙවුවට පාඩු නැතියි බියකින් තොරව නිර්දේශ කල හැකි සැණෙලි වියුම වචනයේ හොදම එකෙන් මටනම් පට්ටය.

උපේක්ෂා ප්‍රේමතිලක

2017.09.10

https://www.facebook.com/upeksha.premathilake.1/posts/798118160370320

රාත්‍රිය ආරම්භ වී තිබුනි. රැහි හඬ වෙනුවට අතරින් පතර වේගයෙන් ඇදෙන රථයක දෙකක ටයර් වල උනුසුම් සිප ගැනීමෙන් හෙම්බත්ව ගිය මාර්ගය හීන් හඬින් නඟන කෙඳිරිය අවකාශය පුරා පැතිර යන හඬ.
සඳ අවපසව.. ගණ කලු අහසක එකත්පසව...
තරු බියෙන් මෙන්... ඉදහිට බලමින් යලි සැඟවෙමින්...
අංශක 90 ක කෝණයක රතු කොළ එලි දල්වන ඇන්ටෙනාවක්..
එකවරම වළාකුළු අතර ඇදී යන සැනෙළි වියුම්....

එකක්...? දෙකක්... නෑ 13 ක්....

13??? නපුරුයි!!!!

ඒක ඉලක්කමක්... නපුරක් නෙවෙයි....

පැයකට සියලු වියුම් දෙපාරක් කියවමින්....
යලි යලිත් හිතමින්...
චන්ද්‍රසේනලා රුවන්ලා ආදරය විඳින විධි...
රෙඩ් ඇන්ඩ් බ්ලැක් ලේඩි...
ලා කහ ගෝවා මල්..
වැඩිම වේලාවක් කියවූ යලි යලිත් කියවන වඩාත් කැමතිම ස්වයංවරය...

කෙටිම කෙටි නොහොත් ක්ෂුද්‍ර කතා එකතුවක් සැනෙළි වියුම්.. අහසෙහි ඇඳී මැකී ගොස් නැවතත් නොහිතන තැනෙකින් මතුවන විදුලි සරක්....
කටපාඩම් වෙන තරමට නැවත නැවතත් කියවන අනිල් හේරත් ගේ ක්ෂුද්‍ර කතා එකතුව.. අමුතුම වර්ගකිරීමක් සහිතව..
කෙටි නමුත් ගැඹුරු අරුතැති...

රාත්‍රි ය නැවත නිහඬව .. සැනෙළි වියුම් වලට ඉඩ දෙමින්...

මහේෂ් රත්නායක

2017.09.18
https://www.facebook.com/groups/sinhalareaders/permalink/1479509325458563/
සැණෙළි වියුම් කියැවීමි . කලෙකින් හමුවූ වෙනසක් ඇති කළ කතා කිහිපයකි . කතාවක් හෝ දෙකක් කියවා පසෙක තබන්නට සිතා අතට ගත්තද අවසානය තෙක්ම බිම නොතබා කියවා නිම කළෙමි. සියුම්ය ඉසියුම්ය. නමුදු විසල් ය . හැඟුම් දොඩමළු කරන සුලු ය . කියවන්නට වෙහෙසක් නැති අකුරු ඇමිණුම් මත් කරන සුලුය. බොහෝ දෑ කියන්නට අනවැසිය.

උපමා රූපක ද බහුලය. කතාවන් කවිකමක් මෙනි.

නමුදු තැනෙක දෙකක කිහිපයක කෘතිම බවක් නොමදුටුවාද නොවේ. ගණන් ගත යුතු නැති තරම්ද නොකියමි. රසවින්දනයට බාධා කළ හැකි තරම් නොවේ . නමුත් හිත අඳින සිතුවම සියුම් ඉදිකටු තුඩකින් සූරා දමන සෙයකි.

වෙනස් අත්දැකීමක් හිත සංයම කරන කාව්‍යමය හැඟුමක් ගන්නට කැමති නම් කියවිය යුතුමය.

රවීෂ තිලකවර්ධන

2017.09.20

https://www.facebook.com/ravisha.thilakawardana/posts/10214163693549745

ෆේස්බුක් ආපු කාලෙ ඉඳලම මුණ ගැහුන සුපිරි ලියන්නෝ බර ගානක් ඉන්නවා. ඉතිං දිගට දිගට කියවද්දි අපි ඒ රයිටර්ස්ලගෙ කියවීම් ගැන එකක් හිතෙන් හදා ගන්නවා. Waruna යා කියන විදියට පූර්ව නිගමන අගතිය කියන භයානක රෝගයෙන් පෙළෙන මම වගේ එකෙකුට මේක කෝමටත් වෙනවා.

ඉතිං ඒම එළඹුණු පූර්ව නිගමන තුනක් තමයි Rasika Gunawardana , Anil Herath, Charmi Sam තුන් දෙනාම කවදාවත්ම පොතක් ගහන එකක් නෑයි කියන එක. වාමි සැම් තියෙන කඩප්පුලි කමට කාව හරි ට්‍රොල් කරන්න ලියනව මිසක් උංට ඒම සීරියස් වැඩක් කරන්න බෑ.

රසිකා අක්කා පොතක් ගහනව නං ඒක හෙණම අමාරු වැඩක් වෙයි . තේ කෝප්පෙ ඉඳලා චක් රාවාට වෙනකං එයාගෙ රීඩිංස් පිටු තිහ හතළිහකට ආවොත් ඒක එක අතකට අපරාදයක්. ඊට පස්සෙ අනිලා . ලියන එක සුපිරියටම ලිවුවා වුනත් හරියට අපිට වුවමනාවට වගේ ඉඳලා හිටලා මොනා හරි ලියන මේකා කොහෙ පොත් ලියන්නද?

කෝම හරි ඉතිං පූර්ව නිගමන අගතිය විසින් මට ආපහු කෙළවලා. අනිලා පොතක් ලියලා. මට පොතක් ගන්නං කියාපු එකා සාමාන්‍යයෙන් ඒ වගේ වැඩක් වගකීමෙං කරන විදිය ගැන හොඳටම දන්න නිසා ජවිපෙ ආණ්ඩුවක් එනකංවත් මට ඕක කියවන්න බැරි වෙයිද කියලා හිතෙන නිසා මේක පොත කියවන්න කලිංම ලියන්න හිතුවා.

Anil Herath කියන්නෙ මට අනුව නම් ලස්සනම හැදෑරීමක් ඇති සුපිරිම ක්‍රිටික් කෙනෙක් . ගොඩක් අවුට් ස්විංගර්ස් වලට බැට් එක උස්සලා නිදැල්ලෙ යවන නිසා අපිට මැන් ගෙ කියවීම් වැඩිය දැනෙන්නෙ නෑ. හැබැයි ඉඳල හිටල හරි කවර් ඩ්‍රයිව් එකක් ගැහුවොත් අන්න ඒක තමයි පාර

පොත තවම අතට නොලැබුණ නිසා කියවල තියෙන්නෙ මේ තියෙන පසු කවරෙ විතරයි . ඇතුළෙ මොකුත්ම නොතිබුනත් මට නං මේ ටිකම වුනත් ඇති ඉතිං

කල්පනා ඇම්බ්‍රෝස්

2017.09.20

https://www.facebook.com/permalink.php?story_fbid=10155594208017988&id=582957987

"මොණර පිල් වැටී ගියේ ය . සිංහ කේසර ලිහී වැටුණේ ය. "

ඒ අනිල් හේරත් ජනප්‍රියවාදී ශරීරමය ජීවිත දෙකක ඉරණම වචන අටකින් කියන හැටි ය . පොත 'සැණෙලි වියුම්' ය.

අනිල් ගේ කෙටි කතා කෙටි ය. කෙටි ම කෙටිය. ෆ්ලෑෂ් ෆික්ෂන් වර්ගයට (ඒ කෙටි කතා ප්‍රභේදය ගැන මුලින්ම ඇසුවේ සුදර්ශන සමරවීරගෙනි ) අයත් ය. ජීවිත ද සමාජය ද අමුතු තැන්වලින් විච්ඡේදනය කොට ෆ්ලෑෂ්මය ආලෝක ධාරා දල්වා හරස්කඩ පෙන්වයි. මහා වනාන්තරයකට පිවිසෙන කුඩා පටු මං පෙත් බඳු ය. කැමැත්තෝ එහි දුරින් දුරට වැද උඩු වියන් ද යටි වියන් ද

විඳගත යුත්තාහ. ජීවිතය දෙස හෙලන දයාර්ද්‍රවූ ද සමාජය වෙත හෙලන උපහාසාත්මක වූ දෘෂ්ටිය ය.

අනිල්ගේ අනුභූතීන් නිපන් තැන් විවිධ ය . ඒවා කාර්යාලවල, හෝටල් කාමරවල, දේශපාලනික අරගල බිම්වල , ඇමති කාමරවල, සාම්ප්‍රදායික නිවෙස්වල ආලින්ද සහ නිදන කාමරවල, පාළු රංග ශාලවල, යුධ හමුදා කඳවුරුවල, යුධ බිම්වල මිනිස් ජීවිතවලට අහිමි කරන ලද ප්‍රේමය ලෙස ද උදුරා ගනු ලැබූ සහ චප්ප කරනු ලැබූ සිහින ලෙස ද පණ ලබයි. ඉසියුම්ව නව සිහින අතුරයි.

"ඔහු.
අඩි පහයි අඟල් නවයහමාරක් උස වූවේ ය . රෙඩිමේඩ් කමිස ඇන්දේ ය. එහෙයින් පපුව සහ උදරයේ මිම් නො දත්තේ ය."

වාක්‍ය රටා වෙනස් ය. සම්ප්‍රදාය සහිත ය. විටෙක රහිත ය. සංකේත, රූපකාර්ථවලින් පොහොසත්

ය. කාලාන්තරයක වෙනස වැකියකට දෙකකට හකුළුවා රූපමය ලෙස කියා පෑමට ඇති හැකියාව අපූරූ ය.

කියන්නට දෙයක් තිබීම ද කියන්නට විදිහක් තිබීම ද සියුම් සැතකින් කියවන්නා විදින්නට හැකිවීම ද සැණෙලි වියුම් හි අපූර්වත්වය යි.

"මාංචු.
එකම යකඩින් තනා තිබිණි. යතුරු පමණක් වෙනස් ව"

ස්තුතියි අනිල්, දිගටම ලියන්න.

රසිකා ගුණවර්ධන
2017.09.20
https://www.facebook.com/rasika.gunawardana.9/posts/10213093323760669

දිනකර ,සඳෙහිද තරුවලද ප්‍රභාව නැතිකරමින් පායා ආවේය.

හිරුරැස් ,ගං ඉවුරෙහි වූ තරුණයාගේ මළ සිරුර නහවමින් ගලා ආයේය.

තරුණයාගේ සුරත අපිළිවෙලට වැඩීගිය නියපොතු වලින් යුත් ඇඟිලි පහකින් යුක්ත විය . නියපොතු ,පෙරදින සැඳෑ යාමයේ තමා වැළඳගෙන සිටි පෙම්බරියගේ පිටෙන් ගැලවී ආ අපිවර්මයෙන් ගැවසී වුවද අප්‍රානිකවම වූයේය .

ගඟ සයුර බලා ගලා යමින් තිබිණ.

මගේ ප්‍රියතම කතාකාරිය අරුන්දතී රෝයි ගේ අලුත් පොත ගන්නකල් මම අනිල්ගේ පොත කියෝනවා.

මීට හුඟ කාලෙකට ඉස්සරයි මම කිව්වේ අනිල්ගේ ලියමන් මට අරුන්දතී සිහිපත් කරවන බව.
බොරු කියන්න එපා කියලා එයා කිව්වට මම දන්නවා අනිල් ඒකට ආස බව.

ඔව් අනිල් ඔයා පොත කරන්න තිබුනේ මීට හුඟක් ඉස්සර . මම මුලින්ම කියවපු ඔයාගේ පලවෙනි කතාවම හරි වෙනස් , හරි නිර්භීතයි . එක පාරක් කියෝපුවම ඒවා මතක හිටියා . ඔයා කණ්නාඩියක් අරගෙන අපිට අපිවම පෙන්වනවා.හැබැයි මේ කණ්නාඩිය ටිකක් වෙනස්.
අපේ පාට තට්ටු ,කුරුලෑ කැළැල් පිරුණු හම විනිවිද ගිහින් අපේ කැත පේන විදියටයි සකස් කරලා තියෙන්නේ.

ඉතින් අපි කවුරුවත් නැති වෙලාවක් බලලා අනිල් අපිට දුන්නු කන්නාඩියෙන් අපිවම නරඹනවා.

අපි කැතයි තමයි අනිල් ,ඒ බව අපිට පෙන්නුවාට ඔයාට ස්තූතියි.

## සිතුවිලි සිතූ

2017.09.21

https://www.facebook.com/groups/sinhalareaders/permalink/1482774975131998/

මේ පොත කියවීමට පෙර මම Flash Fiction හෙවත් කෙටිම කෙටිකතා පිළිබඳව දැනගෙන සිටියේ නැත. මේ පොත පිළිබඳව මුහුණුපොතේ පළවූ විවිධ සටහන් කියවීමෙන් පසුව මෙය කියවා බැලීමට සිත් විය.

මේ අතරතුර රචකයා විසින් ලියූ එක් සටහනක් කියවීමට ලැබුණි. ඒ මෙහි එන "හෙමින් යන බස්" නම් කෙටිකතාවයි. එය කියවීමෙන් පසුව මේ පොත කියවීමට ඇති කැමැත්ත වැඩි වූ බව කිව යුතුය.

Flash Fiction යන්න අන්තර්ජාලයේ අර්ථ දැක්වෙන පරිදි ඉතාම කෙටි නමුත් චරිත සහ plot development දැක්වෙන කතාය. එවැනි කතා 13 ක් මෙහි ඇත.

ඒ කෙටිකතා වලින් වඩාත්ම සිත් ගත් කෙටිකතාව "රතු සහ කළු " ය. සීමිත වචන සංඛ්‍යාවකින් ලොකු කතාවක් කීමට උත්සහ කරන කතුවරයා සෑම වචනයකින්ම උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයට කතාව ලිවීමට උත්සහ කර ඇති බවක් හැඟේ . සමහර කතාවල සැකිල්ල පමණක් ඇති අතර කියවන්නා කතාව ගොඩනගා ගත යුතුය.

පළමු කියවීම ඉතා වේගවත් වූ බැවින් කාලය ගත කර සිදු කරන ලද වේගවත් කියවීමකින් පසු මේ සටහන බිහිවිය . කියවූ අයගේ අදහස් එක්කිරීමට හැකි නම් අගනේය.

බෝධිනී සමරතුංග

2017.09.23

https://www.facebook.com/groups/1390584254604786/permalink/1853020778361129/

අනිල් හේරත් විසින් රචිත සැණෙළි වියුම් ... (පියුම් කියලත් කියවුනා ) මට හමුවෙන්නේ සම කුටියෙන්. කෙටි කතා පොතක් !

හැබැයි මේක අපි කියවන කතා සම්ප්‍රදායෙන් වෙනස් ! හැම වාක්‍යයක් ඇතුලෙම කියවෙන කතාවක් එක්ක, අපට හිතා ගන්න , අපේ සිතුවිලි එක්ක සංවාද කරන්න ඉඩ හරින ලෙස ලියැවී ඇතැයි මට සිතේ.

සාහිත්‍යකරනයේ නව මානයන් සොයා යන අනිල් හේරත් මහතාට සුබ පතමි.

රතු සහ කළු, කෝච්චි සහ ස්වයංවරය, මුදු සහ කෙස්, එකිනෙක නොගැලපෙන වචන දෙකක් දෙබස් වැඩි විස්තර අඩු කතාවේදී එකිනෙක හා පෑහෙන අයුරු වියමන් කරනා ආකාරය විශිෂ්ඨ ය.

"ක්‍රිශාන්ත සලිතව ගියේය. තදින්. නොදැනෙන්නට තරම් සෙමින්. "

මේ ඔහුටම ආවේනික බස් වහර අපව නැවත වාක්‍යය කියවන්නට පොළඹවන සුළුය. ඇතැම් තැනක ප්‍රෙහේලිකාවකි , අප තනිව විසඳුම් සොයා යා යුතු.

තවම කිහිපයක් කියවා ඇති නමුත් පොත් සල්පිලේ ඇති ආරංචිය පොත් කියවන සහෘදයන්ට කියන්න ඇති ඕනෑකම නිසා මෙසේ ලියමි.

ලහිරු කිතලගම

2017.11.01

https://www.facebook.com/aththanews/posts/1902834276711239

කෙටි කතාවේ සුබ ලකුණු

මේ මොහොතේ ලාංකේය කවිය, නවකතාව සහ කෙටි කතාව පිළිබඳ පවතින මතවාදයන්, ප්‍රවණතාවන්, සාධනීය සහ නිශේධනීය ලක්ෂණයන් කුමනාකාර වුවද දිනෙන් දින උක්ත මාධ්‍යන් සඳහා පිවිසෙන තරුණ නිර්මාණකරුවන්ගේ සංඛ්‍යාව වැඩි වන බවක් පෙනෙන්නේ ය. ප්‍රමාණාත්මක ව මේ කලා මාධ්‍යයන් සඳහා තරුණයන් දක්වන දායකත්වය සාධනීය වන්නේ එකී කෘතිවල ඇති ගුණාත්මක බව අනුව ය. දැන් පාඨකයින් සිටින්නේ මේ සියලු කලාවන් වෙනස් ව කියවා ගන්නා මොහොතක මෙන් ම අදාළ සාහිත්‍ය මාධ්‍යයන් තිබෙන්නේ ද මීට අවුරුදු කීපයකට කලියෙන් තිබූ තත්ත්වයට වඩා වෙනස් තැනක ය.

ඒ නිසා පොතක් කළ පමණින් එය අදාළ සාහිත්‍ය මාධ්‍යයට කෙරෙන නිර්මාණාත්මක දායකත්වයක් නොවන්නේ ය . ගුණාත්මක දායකත්වයක් සැපයීමට නම් වැඩේ ඇතුළේ ද වැඩ කළ යුතු වන්නේ ය.

කවිය සඳහා කෙරුණ තරුණ මැදිහත් වීම පසුගිය කාලය පුරා වඩාත් කැපී පෙනෙන තැනක තිබුණ මුත් කෙටි කතාව සඳහා එවැනි තත්ත්වයක් නොතිබුණේ ය . නමුත් මේ වසරේ තරුණ නිර්මාණකරුවන් කීප දෙනෙක් ම කෙටිකතාව සඳහා ප්‍රවේශ වී තිබෙනු දක්නට ලැබෙන්නේ ය . කළු සමනලයාගේ පොත් මේසයේ ගොඩගැසුණ මේ වසරේ පළ කෙරුණු තරුණ නිර්මාණකරුවන්ගේ කෙටි කතා සංග්‍රහයන් කීපයක් මෙසේ ය. සුදර්ශන සමරවීරගේ ‘සුනෙත් කාන්තගේ ශෝකාන්තය’ , සමිත බී අටුවබන්දෑලගේ ‘හතර වන ජයසිංහ’, සරද සමරසිංහගේ ‘කැත ගැහැණියකගේ හීනය’ ,

ආශා රළපනාවගේ ‘ලේ මාපිලා’ , අනිල් හේරත්ගේ ‘සැණෙළි වියුම්’. මේ කෘති අතරින් කීපයක් කළු සමනලයා සම්පූර්ණයෙන් කියවා හමාර කොට ඇති අතර ඇතැම් කෘති තවම කියවමින් සිටින්නේ ය.

කියවූ කෘති දෙකක් පිළිබඳ කළු සමනලයාගේ විඳීම සටහන් කරන්නේ තරුණ ආගමනයේ ගුණාත්මක බව ඔස්සේ දැනෙන ප්‍රහර්ෂය නිසා ය. මෙය හුදෙක් ම කළු සමනලයාගේ විඳීම විනා විචාරයක් නොවන්නේ ය.

නව පරපුරේ ප්‍රතිභාපූර්ණ කවියෙකු වන සමිත අටුවබන්දැල දැන් කෙටිකතාකරුවෙකු සේ පාඨකයා ඉදිරියට පැමිණ තිබෙන්නේ ය . සමිතගේ කතාවලින් පාඨකයාට බල කෙරෙන්නේ ඒ කතා එක හුස්මට කියවා බොහෝ වේලා ඒ ගැන සිතන්නට ය. සමිත භාෂාව හා සංකල්ප රූප සමඟ ගනුදෙනු කරමින් අලුත් සිත්තමක් චිත්‍රණය කරන්නේ ය.

සැබැවින් ම කළු සමනලයාට දැනුනේ සේකර ගේ අඛ්‍යාන කාව්‍ය ස්වභාවය සමිතගේ කතාවල තැවරී ඇති බවක් ය . කතා හැඩය සහ කතා ගොඩ නැගීම විටෙක අඛ්‍යාන කවි ස්වරූපයක් ගන්නේ ය. සැබැවින් ම 'හතරවෙනි ජයසිංහ'හි එන භාෂාව සරළ, උත්ප්‍රාසාත්මක සහ කාව් යාත්මක වූවකි. සංකල්පරූපයන්ගෙන් පිරීගිය එකකි.

'මල් ශාලාව ! මල්ශාලාව රෙපයාර් කරාට පස්සේ මඟුල් ශාලාවක් වගේ බැබළෙනවා . සෙනට් ගාගෙන පවුඩර් උලාගෙන . මූසල අමනුස්ස පාට ගිහින් දැන් මනුස්ස පාටක් ඇවිත්.
දිලිසෙන මිනී පෙට්ටි හිනාවෙන මල්වඩම් අලූතින් ඇඳුම් ඇඳපු සේවකයින්ගේ පරණ වුණත් අලූත් මුහුණු."

(අමරණීය මරණය)

” තිස්සෙම ලුණුවතුර නාලා, මහ මුහුදෙන් ගොඩට ආපු ඉර , නැගෙනහිර අහසට වෙලා වලාකුළු තුවායෙන් මුහුණ පිහා ගන්නවා . ඒ ඉර බටහිර අහසින් මතු වුණත් අපේ සම්බන්ධෙට අපේ ගෙදරින් කැමති වෙන්නේ නෑ මහතුන්” (මහතුන්)

අහම්බෙන් උපුටා ගත් තැන් කීපයක් ය මේ දැක්වූයේ. සමිතගේ කෙටිකතාව මූලිකවම ගලා යන්නේ උත්ප්‍රාසය ඔස්සේ ය. එදිනෙදා සමාජයේ හමුවණ බොහෝ දෑ සමිත මතු කරන්නේ හාස්‍ය කැටිකොට ගෙන ය. මේ කතා කියවන කාටවත් ඒ උත්ප්‍රාසයෙන් වහන්වීමට නොහැක්කේ ය. ශූර කතාකාරයෙකු බව සිය ගෙතීම්වලින් ඔප්පුකරන සමිතගේ ආගමන සතුටක් ය.

කෙටි කතාව පිළිබඳ තිබෙන නොයෙක නිර්වචනයන් බිහි වන්නේ දැනට ලිය වී ඇති කතා අනුව ය. ඒ නිසා මේ කිසිදු සාහිත්‍ය මාධ්‍ය-යක මූලික හැඩතල ස්වභාවය හෝ නිර්වචන

ගැන නිශ්චිත අදහසක් දීම අසාධාරණ යැයි යන්න කළු සමනලයාගේ අදහස ය. මන්ද හෙට ලියැවෙන කතාවක් ලෝකයේ මෙතෙක් ලියැවුණ හැම කතාවට ම වඩා වෙනස් වීමට බැරි නැත්තේ ය. එවිට ඒ කතා කෙටි කතා නොවේ යැයි කීමට ද කිසිවෙකුටවත් නොහැක්කේ ය.

දෙවනුව කළු සමනලයා කියවා අවසන් කළ අනිල් හේරත්ගේ 'සැණෙලි වියුම්' යනු කළු සමනලයාගේ කියවීමේ අගාව දල්වාලන කෘතියක් ය. තවදුරටත් කුමක් හෝ කතාවක් ලියා තැබීම කෙටි කතාවක් නොවන්නේ ය යන්න පෙන්වා දී ඇති ලේඛකයෝ අතලොස්සට අනිල් එකතුවී ඇති බව කළු සමනලයාගේ අදහස ය. අනිල් කරන්නේ අනිල්ට ඕනෑ දේ ඕනෑ විදියට ලිවීම ය. උත්තම පුරුෂ හෝ වේවා ප්‍රථම පුරුෂ හෝ වේවා මේ ඕනෑම දෘෂ්ටි කෝණයකින් ලියා ඇති ඇතැම් කෙටි කතා කියවන විට (අනිල්ගේ නොවේ ) කළු සමනලයාට

දැනෙන්නේ ඒ කතාවෙන් පිට කළු සමනලයා සිටින බවක් ය. එවිට පාඨකයා හා කතාව අතර පරතරයක් ඇත්තේ ය . නමුත් අනිල්ගේ කතා කියවනව විට පාඨකයා සිටින්නේ කතාව ඇතුළේම ය. ඒ මොහොතේ ය. ඒ චරිත සමඟ ය. අනිල්ගේ ලිවීමේ ස්වභාවය එසේ ය . භාෂාවේ ආලවට්ටම් නොදමන්නේ ය . හැබැයි භාෂාවට ඕනෑ ලෙස නොව අනිල්ගේ සංරචනයට ඕනෑ ලෙස භාෂාවෙන් කතා අබන්නේ ය. අති තීක්ෂණ සංජානනයකින් සිය අවට බොහෝ දේ අනිල් අල්ලා ගන්නේ ය . එසේ අල්ලාගෙන ඒවා පාඨකයාට ඉදිරිපත් කරන්නේ පාඨකයා ද ඒ හැම මොහොතකම, හැම හැඟීමකම, හැම හුස්මකම කොටස්කරුවන් විනා ඒවායෙන් පැන යෑමට නොහැකි වන සේ ය.

අනිල්ගේ බොහෝ කතා පිටු දෙකක් ඉක්මවා නොයන්නේ ය. නමුත් ඒවා සුළුපටු ලෙස විස්තර කළ හැකි ඒවා නොවේ. තීරුවක ඒ ගැන ලිවීම

විහිළුවක් වන්නේ ය. අතැම් කතා කිය වූ පසු කළු සමනලයා ගොළු වුණේ ය. නැවතුණේ ය. කුඩා ලියැවීමක් ඔස්සේ කළු සමනලයාගේ ඇතුල් හදවත් ප්‍රශ්න කරන්නට අනිල්ගේ කතා සමත් වන්නේ මහ පිපිරීමක් ඔස්සේ ය.

මේ කතා කියවූ පසු කළු සමනලයාට දැනෙන්නේ කෙටිකතාවේ සුබ ලකුණ වෙනුවෙන් පැමිණි මේ කෝඩුකාරයින්ගේ කතා මහා පිපිරීමක් කරන බව ය.

උදාරි රාජපක්ෂ
2017.11.18
https://www.facebook.com/groups/sinhalareaders/permalink/1534827543260074/

සැණෙළි වියුම් QR කෝඩමය ගුණැති කෙටිම කෙටි කතා එකතුවකි.

"සැණෙළි වියුම් " පෙර කතා මුහුණු පොත ඔස්සේ දුටුවේ සාහිත්‍ය මාසයට කලකට පෙර සිට ය. නමින් දැන උන්නා මිස අන්තර්ගතය ගැන අල්පමාත්‍රික දැනීමක් නැතිවද සයුර කුටියේදී එය මිලට ගන්නට හිතුණේ ඒ පූර්ව මතකය ඔස්සේ ය. මඟ හැරුණානම් අපරාදේයැයි හිතුනේ කියවා අවසන් කළාට පසු ය.

කෙටිම කෙටි කතා 13 කි,එකිනෙකට වෙනස් එහෙත් එකිනෙකට නොපරදින අපූර්වත්වයක් කැටිකරගත්.

කහ සහ ගෝවා ,කැති සහ පිහි, වැලන්ටයින් දෙඅන්තයන් වෙත දිශානුගතව ගලා යන්නේ බුත්සරණේ ශෛලිය මතකපත් කරමිනි .ඒ වැකි කෙටිය.එහෙත් ඒවා යට සැඟවී හිදිමින් එළියට එබෙන කතන්දර හරි දිගය.මේවා QR කෝඩමය ග්‍රණැති කතායැයි කීවේ එහෙයිනි.මන්ද ජීවිතවල මහා පදාසයන් සැණෙකින් ස්කෑන් කර අප ඉදිරියේ දිගහරින හෙයිනි.

"ඇතැමුන් එවූ බෝනික්කන් තෑගි ලෙස ගත්තාය.
කාටත් හොරෙන් සැඟවූවාය."

-4 වන පිටුව. කහ සහ ගෝවා-

මේ එවන් බොහෝ නිදර්ශන අතරින් මං ආසම වූ එකකි.ඇතැම් කතා දිගු වන්නේ එක හුස්මක තරමටය. එහෙත් පොතම කියවා නිම කරන්නට බොහෝ වේලා ගත විය.මන්ද අටෝරාසියක් පරිකතා , අඛණ්ඩ කියවීමකට බාධා කරමින් මතකයට එබුණ හෙයිනි.

එසේම පරිස්සමෙන් කියවිය යුතු වූ හෙයිනි .ඒ , වචනයක් මඟ හැරීම කතාවෙන් ලොකු කොටසක් මඟ හැරුණා හා සමාන වන තරමට වචන පෙළ ගැස්ම වගකීම් සහගතව සිදු කොට තිබූ හෙයිනි.ඒ වියමන්හි රිද්මය හරි අපූරුය.

ලියනගේ අමරකීර්ති

2017.12.12

https://www.facebook.com/liyanage.amarakeerthi/posts/10213316098528676

අනිල් හේරත්ගෙ සැණෙලි වියුම්

කෙටි කතාව හරියටම මේකයි කියන එක කරන්න බැරි වැඩක්. අනික ඕනෑම ප්‍රධාන ශානරයක නිර්මාණශීලිව වැඩ කරන කොට ඒ ශානරීය සීමා නිර්මාණශීලි ආකාරයෙන් පුපුරා යනවා. එවැනි පුපුරා යාම් නිසා අලුත් උපශානර පැන නගිනවා. අනිල් හේරත්ගෙ සැණෙලි වියුම් අපූරු පොතක්. එව්ව කෙටිකතාද නැද්ද කියන එක මං දන්නෙ නෑ. නමුත් එව්වා අපූරු කතා. තේමාව, භාෂාව, ව්‍යූහය කියන දේවල් හරියටම අපූරුවට එකතු වුණ කතා.

සියුම් සහ නිර්දය නිරීක්ෂණ ශක්තියක් ඇති ඔහු කෙටිකතාව මාධ්‍යයක් විදියට තෝරගෙන වැඩ

කළොත් අපේ කෙටිකතාවට ලොකු සම්පතක් . එත් අලුත්ම කතා විධියකින්, නමක් දෙන්න බැරි විදියකින්, කතා ලියන කෙනෙකුට නමක් දෙන්න පුළුවන් කතා ලියන්නැයි කීමත් හොඳ දෙයක් නෙමේ . ඒකත් එක්තරා ශානරීය හිංසනයක්. ඔහු සමහර විට මෙහෙම කතා ලියලා තියෙන්නෙ ඒ ශානරීය හිංසනයෙන් මිදෙන මගක් විදියට.

මම අහවල් වාදියෙකියි කිය කිය පාඨකයා පළවා හරින මහ පොත් ලියන අයට වඩා පාඨකයා සමග කතා කිය කිය රසවිඳින මේ කතාකාරයා හරිම අපූරුයි. ඔහු තමන්ගෙ පරම්පරාවෙ මහේක්ෂ ගැටලු පවා අල්ලගන්නෙ ක්ෂුද්‍ර ආකාරයට.

මං දන්නෙ වත් නැති , සමහර විට දැකලවත් නැති, මේ ලේඛකයට මම සුබපතනවා . අර අනුරාධ මහසිංහගෙ බැම්ණිති පොත ගිය අවුරුද්දෙ කළා වගේ මගෙ සිත පුදුම කරපු

පොතක් තමයි සැණෙලි වියුම් . දැනටමත් මම මේක ආඛ්‍යාන ව්‍යූහ ගැන මගේ පන්ති කාමර දේශනවලටත් පාවිච්චි කළා.

ලේඛකයො විදියට පශ්චාත් නූතන තත්වය තුළ අතරමං වුණ තරුණ පිරිස් දෙස යම් දයානුකම්පාවකින් බලන්නත් ඕනෙ. මුරකම් ඒක අපූරුවට කරනවා. අනිල්ගෙ උපහාසෙ ඇතුළට පොඩි දයා ගුණයකුත් ආවොත් හොඳයි.

නැත්නම් අර එරික්ගෙ සමහර කතාවල වගේ වරප්‍රසාදිත ලේඛකයගෙ උඩඟු උපහාසය වගේ එකක් තමයි අර අලුත් තාරුණ්‍ය වෙත එල්ල වෙන්නෙ. එහෙම හිනාවෙන එක හරි ලේසියි.

කමල් පී අලහකෝන්

2018.04.24

https://www.facebook.com/permalink.php?story_fbid=614883045570904&id=100011476425724

අනිල් හේරතුන්ගේ,"සැනෙලි වියුම්"කෘතිය පිළිබඳ සමාජ යථි ව්‍යූහයේ ප්‍රමාණවත් සංවාදයක් හෝ ගොඩනැගිය යුතුයැයි,සිතීමි, පැවසීමි. ප්‍රයත්නයක්ද දැරීමි.

නමුත් එවැන්නක් වූවා යැයි නොසිතමි.
මා එසේ සිතූයේ ඇයි?
අධ්‍යතන ලාංකීය සමාජය "ස්ටක්"ව ඇති බවක්ද,
ආගාධය.කරා ගමක් කරන බවක්ද,
අනාගත දැක්මක් ඇති කිසිවක් සිදු නොවන
බවක්ද පැවසේ!

මේ සියල්ල ඇත්තය.!
එවන් පසුබිමක් තුළ නිර්මාණ කරුවාගේ කාර්ය භාරය කුමක්ද?

මා විස්වාසකරන අන්දමට අධ්‍යතන නිර්මාණ කරුවා
මේ මොහොතේ කලයුතුව ඇත්තේ,
මේ සමාජ කුණපය පිළිබඳ "යථාව"උද්ධරනය කොට දැක්වීමයි!
නිර්මාණාත්මකව.

මන්ද යක් බහුතරය පවත්නා දෙයම"යථාව"යැයි,
එහම ඇලී ගැලී පවත්නා ස්වභාවය නිසාවෙනි..

අනිල් වර්තමානය කියවන විලාසය අපූරුය !
නැවුම්ය.
නිර්මාණාත්මකය.

"ඇණ කාලයක් තිස්සේ දිරා ගියාවුවද,
මසටම කාවැදී තිබුන සිල්පර කොටන් අත
නොහැර එල්ලීගෙනම
සිටියේය.ඇදෙමින්,සැලෙමින්යළි නිසොල්මන්
වෙමින්.
කෝච්චියක් යන වාරයක් පාසා...."

(කෝච්චි සහ ස්වයංවරය,පිට:13)

අනිල් පළමුකොට සම්මත ආකෘතීන් කිසිවක්
මායිම් නොකරයි!
ඒවා කවි හෝ කෙටිකතා නොවේ.
නොවන්නේද නොවේ!
අධ්‍යතනය ප්‍රකාශමාන කිරීම අරභයා පවත්නා
ආකෘතීන්හි නොසමත් භාවය අනිලුන් විසින්
අතික්‍රමණය කරනු ලබයි.
එසේම රසභාව උත්පාදනය සඳහා ප්‍රෝත්ත්සාහී
නොවන අනිල් සිදුවීම්හි හා ප්‍රපංචයක්හි පවත්නා
"ද්විසධනාත්මක ස්වභාවය" සිනමාරූපී ක්ෂණ
සමාන්තර ඡේදන විලාසයෙන්ද,

වෙනත්ම සම්මත නොවන, අභූතරූපී විලාස
වලින්ද ඉදිරිපත් කරයි!

ඇතැම්වා ප්‍රෙහෙළිකාමය ගුණයක් දෙවන්නේ
එය එහි අනන්‍යතාවය විය යුතුයැයි අනිල් සිතූ
නිසා විය යුතුය.

"ලක්මිණී
සිය මේස ලාච්චුවෙහි වූ තුවාය ගත්තාය.සුදු
පැහැ.
අඩි එක හමාරක් දිග.අගල් දහ අටක් පළල"
(රතු සහ කළු-පිට 21)

(අඩි එකහමාරත්,අඟල් ද අටත් එකක්ම බව
මෙන්ම,
ඒ දෙකදිග,සහ පළල ලෙස හැඳින්වීම තුළ ඇති
ප්‍රෙහෙළිකාමය ස්වරූපය කියවන්න.)

කෙසේ වුව
මානව ජීවිතයට අනුචිතවූ,
අප්‍රියඅවනාප වූ
සමාජ තතු උද්ධරනයෙහිලා
නවමු ප්‍රකාශන විලාසයන් සමුදායක්
අනිලුන් විසින් සමාජගත කරයි!

"ඔයා කැමතිම වචනේ මොකක්ද?"

ඔහු,මදක් කල්පනා කලේය.
අවිනිශ්චිතව ඇඟිලි කොණක් සැපීය.අනතුරුව
හඬ අවදි කලේය.
"අනේ මන්ද!
පුංචිම කාලෙ නං අම්මා
ඊට පස්සෙ හොඳ ළමයා
එතනින් පස්සෙ පළවෙනියා!ශිෂ්‍යත්වෙ.
ඒ දහය,ඒ තුන,බැච් ටොප්!
රස්සාවක්!වාහනයක්!

"එතකොට දැන්?"

ඔහු කියවිල්ල නැවතීය.පුටුවෙහි හරි බරි ගැසුනේය.
අනෙකා දෙස එක එල්ලේ බලා පිළිතුරු දුන්නේය.

"බම්බුව!"

"ඔයා කැමති ම වචනෙ මොකක් ද ?"

ඔහු
මඳක් කල්පනා කළේ ය.
අවිනිශ්චිතව ඇඟිලි කොනක් සැපී ය.
අනතුරුව හඬ අවදි කළේ ය.

"අනේ මන්ද..!
පුංචිම කාලෙ නං අම්ම..!
ඊට පස්සෙ හොඳ ළමයා..!
එතනින් පස්සෙ පළවෙනියා..! ශිෂ්‍යත්වෙ..!
ඒ දහය..! ඒ තුන..! බැච් ටොප්..!
රස්සාවක්..! වාහනයක්..! "

"එතකොට දැන්..?"

ඔහු.
කියවිල්ල නැවැත්වී ය. පුටුවෙහි හරි බරි ගැනුණේ ය.
අනෙකා දෙස එක එල්ලේ බැලී ය. පිළිතුරු දුන්නේ ය.

"බ ම බු ව"

අනිල් හේරත්

සැණෙලි වියුම

කෙටි කථා එකතුවකි.
වැඩිහිටි පෙම්වතුන්ගෙන් යුතුය.
(විස්තර සහිත අන්තර්ගතය වර්ගීකරණය සඳහා
ඇතුල් පිටු බලන්න.)

creative commons
BY NC SA

9 789557 448602
read.lk
www.read.lk
Cover Design | Tharanga Punchihewa